
# දළදා වරුණ

මහනුවර ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2559 උඳුවප් මස 24 වන ගුරු දින

■ 2015 දෙසැම්බර් මස 24 වැනි බ්‍රහස්පතින්දා



■ නොමිලේ පිරිනමන දහම් පඬුරකි

■ විකිණීම සඳහා නොවේ



# උඳුවප් පුර පසළොස්වක

## පොහොය දිනයේ වැදගත්කම

දොලොස් මහේ පොහොය අතුරින් උඳුවප් පුර පසළොස්වක පොහෙය ලාංකික වනිතාවට සුවිශේෂී වූ දිනයකි. එකල පරාධීනව පසුවූ ලාංකේය වනිතාවගේ විමුක්තිය උදා කළ ප්‍රදීපයක් සේ වූ **සංඝමිත්තා මහ රහත් තෙරණියන් වහන්සේගේ ලංකාගමනය සිදුවූයේ උඳුවප් පුර පසළොස්වක පොහොය දිනකදීය.**

ප්‍රඥව ඇත්නම් නිවන් පුරයට පිවිසෙන මාවතට එළැඹීමට මුළු ගැන්වුණු ස්ත්‍රීත්වය බාධාවක් නොවේ. ඒ බව පසක් කරලමින් අනුලා දේවිය ප්‍රමුඛ කාන්තා පිරිස අනු බුදු මිහිඳු මහ රහතන් වහන්සේ විසින් දේශනා කරන ලද ශ්‍රී සද්ධර්මය ශ්‍රවණය කර සෝවාන් මඟ ඵල ලබා නොබෝ කලකින් උතුම් වූ සකෘදගාමී මාර්ග ඵලද ලැබූහ.

දස සිල් සමාදන්ව කසාවතින් සැරසුණු ආර්ය ශ්‍රාවිකාවන් පැතූ පැවිදි බව ලබාදී සැබෑ කාන්තා විමුක්තිය උදා කරමින් ශ්‍රී ලංකාද්වීපයේ භික්ෂුණී සමාජය පිහිට වූයේ සංඝමිත්තා මහ රහත් තෙරණින් වහන්සේගේ වැඩම කරවීමේ ප්‍රතිඵලය නිසාවෙනි.

මෙවන් වූ මෙහෙයක් වෙනුවෙන් දේවානම්පියතිස්ස නිරිඳුන් දක්වූ රාජ්‍ය අනුග්‍රහය ශ්‍රේෂ්ඨය. දේවානම්පියතිස්ස රජතුමා විසින් සඟමිත් තෙරණිය සමග ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛාවක් වැඩම කරවීමට අවශ්‍ය බව දන්වන සංදේශයක් ලබාදී අරිට්ඨ කුමරු ප්‍රමුඛ දූත පිරිස දඹදිව රම්‍ය වූ පැළලුප් නුවරට පිටත් කළහ.

සිරිලක් වනිතාවද මේ සංසාර දුක් සයුරෙන් එතෙර කරලීමේ උතුම් අපේක්ෂාවන් සඟමිත් තෙරණිය තම පියරජතුමාට කාරුණිකව කරුණු අවබෝධ කරලීමෙන් පසුව මිහිඳු මහරහතන් වහන්සේගේ වචනයටද ගරු කරමින් අශෝක මහ රජතුමා තම දියණිය ලංකාවට එවීමට එකඟ විය.

ශ්‍රද්ධාවන්ත අශෝක රජු ''මාගේ දරු පිරිස සිංහල ජාතියට සේවය පිණිස වේවා'' යි ප්‍රාර්ථනය කරමින් ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛාවක් ලබා ගන්නේ කෙසේදැයි මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේගෙන් කරුණු විචාළේය. එහිදී බුදුරදුන් පිරිනිවන් මඤ්චකයේදී දේශනා කළ අධිෂ්ඨානයක් ගැන දැනුවත් වූ රජතුමා බුද්ධාලම්භන ප්‍රීතියෙන් ඔද වැඩී ගියේය.

ඇඳිලි බැඳගත් රජතුමා බෝධි වෘක්ෂය දෙස බලා සත්‍ය ක්‍රියා කළේය. එම බලයෙන් දක්ෂිණ ශාඛාව සම්බන්ධ සතර රියන් පමණ ප්‍රදේශය හැර සියලුම ශාඛාවන් සෘද්ධි ප්‍රාතිහාර්ය දැක්වීය. මුල් සියයක් අද්දවමින් දක්ෂිණ ශාඛාව රන් කටාරමෙහි පිහිටන විට හිම වළාගැබක් අතරට වැදී මහ පොළොව කම්පිතව ප්‍රාතිහාර්යය පෑ බව වංශ කතාවන්හි සඳහන් වෙයි. දෙව්, මිනිසුන්ගේ මහත් වූ බහුමානයන් මධ්‍යයේ බෝධීන් වහන්සේගේ ඵලයන් හා පත්‍රවලින් සවණක් රැස් විහිදුවමින් මුළු දඹදිව තලයම ඒකාලෝක කරවීය. මේ අසිරිමත් දර්ශනයෙන් අපරිමිත ප්‍රීතියට පත් ධර්මාශෝක නිරිඳුන් දඹදිව් රාජ්‍යයට බෝ සමිඳුන්ට පිදුවේ බෝධිරාජයාණන් වෙන්වීමේ දරාගත නොහැකි ශෝකයෙන් කඳුළු වගුරුවමිනි. ශ්‍රීවය දක්වා ජලයෙහි බැස ගත් දම් සෝ නිරිඳුන් බෝධිරාජයාණන් ඔසවාගෙන නෞකාවෙහි තැම්පත් කළේ උඳුවප් මස ශුක්ල පක්ෂයෙහි පැළ වියේදීය. බෝධියේ ආරක්ෂාවට සිව් රඟ සේනාවත්, සංඝමිත්තා මහ රහත් තෙරණිය ප්‍රමුඛ උත්තරා, හේමා, පසාදපාලා, අග්ගිමිත්තා, දසිකා, ඵෙග්ගු, පබ්බතා, මත්තා, ධම්මදිසා, මහාදේවි, පදුමා, හෙමාසා, උන්නලා, අඤ්ජලී සහ සුමා භික්ෂුණීන් වහන්සේලා සමග අරිට්ඨ කුමරු ලංකාගමනය ඇරඹීය.

ගංගා නම් නදිය මත්තේ සැරැ සිල්ලෙන් අලංකාර වූ යාත්‍රාව රාජ්‍ය දූත පිරිස රැගෙන සත් දිනක් මුළුල්ලේම වින්ධ්‍යා වනය පසු කරමින් තාමලිත්ති නැව් තොටට පැමිණ මහ සයුර තරණය කරද්දී රළ සිඳී සත්වනක් පියුම් පිපී මේඝ වර්ෂා වසිමින් මහා ප්‍රාතිහාර්ය දැක්වීය. ගුවනේ තූර්යෝ වැයුණේය.


නාග සේනාවෝ මහා බෝධිය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් සෘද්ධි විකුර්ණය කළහ. අභිඥබල සම්පන්න සංඝමිත්තා මහ රහත් තෙරණියන් වහන්සේ ගුරුළු වෙස් ගෙන නාගයන් දමනය කළ බව මහාවංශයෙහි සඳහන්ව තිබෙයි.

මෙවන් අසිරිමත් සිදුවීම් පෙළක් මධ්‍යයේ ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාව වඩා හිඳුවාගෙන ලක්දිව් තලයේ දඹකොළ පටුනට වැඩම කළ සඟමිත් තෙරණියගේ ලංකාගමනය සනාථ කිරීමට සාංචි ස්ථූපයේ නැගෙනහිර වාහල්කඩ මුදුණේ නිරූපිත කැටයම සාක්ෂි දරන බව මහාචාර්ය ගෛගර් පඬිතුමා සිය ඉංග්‍රීසි පරිවර්තනයෙන් සඳහන් කරයි.


ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ සමග සංඝමිත්තා මහ රහත් මෙහෙනින් වහන්සේ ලංකාවට වැඩම කළ මෙම ඓතිහාසික සදහම් චාරිකාව දුමින්දගමනය ලෙස හඳුන්වන අතර මේ සමග අටළොස් කුලයක පිරිසද අප මව්බිමට පැමිණි බව ශාසන වංශකතාවන්හි සඳහන්ව තිබෙයි.

**නිව්ටන් ගුණසේකර**

''මේ ලෝකයේ කවරදුවත් වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්.''



# මෙලොවත් පරලොවත් සැප ලබනවාද? නැතිනම් නිවන් දකිනවාද?



ශ්‍රී ලංකාවේ ජනගහණයෙන් 69%ක්ම ඉන්නේ බුදු දහම අදහන අය. බෞද්ධයන් නැතහොත් බුද්ධාගම්කාරයන් වශයෙනුයි පොදුජන සමාජයේදී ඔවුන් හැඳින්වෙන්නේ. එනිසා අබෞද්ධයන් හිඳින දේශයන් අභිබවමින් බුද්ධාගමිකාරයන් හිඳින අපේ රට විනාශ මුඛයට පිවිසෙන්නේ බුදු දහමේ ඇති කිසියම් අඩුපාඩුවක් නිසා යැයි සමහරුන් සිතන බව පෙනෙනවා. නමුත් මෙහි යථාර්ථය අදත් බොහෝ දෙනා වටහාගෙන නැහැ. අප අදහන බුදු සමය මූලික බුදු දහම, බෞද්ධ දර්ශනය සහ බුද්ධාගම යනුවෙන් කොටස් 3කට බෙදන්න පුළුවන්. මේ කොටස් තුන මතුපිටින් එකම දෙයක් වශයෙනුයි පෙනෙන්නේ. නමුත් ඒ පිළිබඳව ගැඹුරෙන් විමසන විට මේ එකිනෙකෙහි පැහැදිලි පරස්පරතා දක්නට ලැබෙනවා. අපි දැන් මේ එකින් එක වෙන වෙනම විමසා බලමු.

### 1. බුදු දහම

බුදු දහම යනුවෙන් හැඳින්වෙන්නේ අඛණ්ඩව පැවත එන ධර්ම-විනය සම්ප්‍රදයයි. මෙම සම්ප්‍රදයන් තුළ ශ්‍රී මුඛ දේශනාවන් වගේම පසුකාලීනව එක්වූ වියත් මතිමතාන්තරත් යම් යම් දුරට ගැබ්වෙලා තිබෙනවා. නමුත් ඒවා වෙන් වෙන්ව හඳුනා ගැනීම අසීරු නැහැ.

### 2. බෞද්ධ දර්ශනය

බුදු දහමෙහි එන මූලික ශ්‍රී මුඛ දේශනාවලින් මතුවන හරය විචාරාත්මකව අධ්‍යයනය කිරීම තුළින් පසුකාලීන වියතුන් බෞද්ධ දර්ශනය (Buddhist Philosophy) නම් විශේෂිත දර්ශනයක් ඉදිරිපත් කොට තිබෙනවා.

බුදුරජාණන් වහන්සේ ත්‍රිලක්ෂණය නුවණින් දැකීම සඳහා දක්වන ලද "දස්සන" යන වදනත් මෙහි එන් දර්ශනය (Philosophy) යන්නෙහිත් විශාල වෙනසක් පවතිනවා. කෙසේ වුවද අපේ මූලික බුදු දහම ජාත්‍යන්තර වශයෙන් ලොව පුරා ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ මෙහි ඇති දර්ශනික ස්වරූපය නිසයි. මතක තබා ගන්න, මෙවන් ගැඹුරු දර්ශනයක් පිළිබිඹු කෙරෙන අන් දහමක් එද මෙද තුර ලොව බිහිවී නැති බව. ලොව පුරාම අබෞද්ධ පඬිවරුන් විශාල පිරිසක්ද එය පිළිගෙන තිබෙනවා.

අපේ රටේ 69%ක් වූ බෞද්ධයන්ගෙන් 90%කටත් වඩා බුදු දහම වශයෙන් දක්වන්නේ මේ බුද්ධාගමයි. නමුත් මේ බුද්ධාගම ඇදහීම බුදු දහම පිළිපැදීම හෝ බෞද්ධ දර්ශනය පිළිගැනීම නොවෙයි. මේ බුද්ධාගම සඳහා මුල්ව ඇත්තේත් බුදු දහම තමයි. නමුත් හුදෙක් අභිචාර විධි මත පදනම් වූ මෙම ප්‍රසිද්ධ බුද්ධාගම ඉතා ශීඝ්‍ර ලෙස කාලානුරූපව පරිණාමය වුණා. එසේ වුණේ බාහිර ආගමික - සංස්කෘතික බලපෑම් ඉවත් බවක් නොමැතිව පිවිසුවා ගනිමින්. ඒ අනුව අද අප අදහන බුද්ධාගම බුද්ධ දේශනාවන්හි මූලික හරය නොතකා මුළුමනින්ම මිථ්‍යා දෘෂ්ටික ස්වභාවයක් ගෙන ඇති බව ඉතා සංවේගයෙන් පැවසිය යුතුයි. මිනිසා විසින් පිළිපැදිය යුතු සදචාර ධර්ම සමුදයක් මත පදනම් වූ බුදු දහමෙහි හරය ඉවතට දමන වර්තමාන සමාජය ධර්ම මාර්ගයෙන් පිටතට පැන අගතිගාමී ලෙසින් කටයුතු කරන අතරේ තමන්ගේ එම ඇවතුම් පැවතුම් සඳහා මේ වනවිට බුද්ධාගමත් ඉතා විපරීත ලෙස

4 පිටුවට ▶

"යමකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ."

සකස් කරගෙන තිබෙනවා. බුදු දහමෙන් කියැවෙන්නේ මිනිසාගේ මෙලොව පරලොව යහපත සඳහා අනුගමනය කළ යුතු ප්‍රතිපද මාර්ගයක් මිස හුදෙක් පූජා හෝ යාඥා ක්‍රමයක් නොවන බව බුද්ධ දේශනා මගින් පැහැදිලි වෙද්දී අපේ බෞද්ධයන් වැදගත් දේ නොවැදගත් දේ ලෙසත්, නොවැදගත් දේ වැදගත් ලෙසත් සලකමින් කටයුතු කරනවා.

## බෞද්ධයා යනු කවරෙක්ද?

බුදුරජාණන් වහන්සේගේ ධර්මය ලොව සියලු දෙනාගේ දෙලොව හිත සුව පිණිස දේශනා කරන ලද්දක්. තිසරණ සරණ එළැඹීමේ නියත ප්‍රතිපදවත් මගින් ආර්ය අෂ්ඨාංගික මාර්ගය නම් වූ එම දහම පිළිගෙන එම මාර්ගයට පිවිස හිඳින තැනැත්තායි බෞද්ධයා වශයෙන් හඳුන්වන්නේ. සමාජීය වශයෙන් සරණ ගිය ගිහියන් සඳහා යොදන්නේ උපාසක උපාසිකා යන යෙදුමයි.

නමුත් අද සමාජයේ මේ "උපාසක-උපාසිකා" යන්න විශේෂිත අරුතක් දනවන්නක්. අද සමාජය උපාසක-උපාසිකා නමින් හඳුන්වන්නේ සිල් රෙදි පොරවා ගත්තවුන් පමණයි. නමුත් බෞද්ධයන්ගේ නිත්‍ය ශීලය වන පංච ශීලයෙහි පිහිටි ගිහියන් වුණත් මේ උපාසක-උපාසිකා යන නම ලැබීම යෝග්‍ය වෙනවා. ඒ අනුව තෙරුවන් සරණ ගොස් නිත්‍ය ශීලයක් ආරක්ෂා කිරීමට බැඳී සිටින පිරිස පමණයි සැබෑ බෞද්ධයන් වශයෙන් හැඳින්විය හැක්කේ. උපතින් පමණක් බෞද්ධ වූ අය ලේබල් බෞද්ධයන් වශයෙන් පමණයි නම් කළ හැකි වන්නේ.

## පන්සිල් බුද්ධ භාෂිතයක්ද?

ගිහියන්ගේ නිත්‍ය ශීලය වන පංච ශීලය බුද්ධ කාලයටත් පෙර සිටම පැවැති උතුම් සදාචාර ධර්ම පද්ධතියක්. තමන් හට සේම අනුන් හටත් අවැඩක්, අයහපතක් සිදු නොකර තමන්ටත්, අන්‍යයන් හටත් අර්ථවත් වන ලෙසින් ජීවිතය ගත කරන අන්දමයි මේ පංචශීල ප්‍රතිපදවෙන් දක්වෙන්නේ. එහි පළමු ශික්ෂා පදය ගෙන බලමු.

"පාණාතිපාතා වේරමණී සික්ඛා පදං සමාධියාමි" යන්නෙහි අදහස "පරපණ නැසීමෙන් වළකිමි" යන්නයි. මෙලොව ජීවත් වන සියලුම දෙනා හට ජීවත්වීමේ අයිතිය තහවුරු කෙරෙන ආචාර විද්‍යාත්මක ශික්ෂා පදයක් ලෙස මෙය දක්විය හැකියි. එසේම පන්සිල් පිළිබඳව කෙරෙන විස්තරයන්හිදී අනුන් වැනසීම පිණිස දඬුමුගුරු, පිහි ආදිය නොඔසවන ලෙසත් තමන් උපමා කොට අනුන්ගේ ජීවත්වීමේ අයිතිය තහවුරු කරන ලෙසත් බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබෙනවා. ඒ නිසා පංචශීලය බෞද්ධයන්ට පමණක් කැප වූවක් යැයි සිතන්නට බෑ. සදාචාර පැවැත්මක් අගය කරන්නා වූ සියල්ලන් විසින්ම වැඩිය යුතු මිනිස් ගුණදම් මාලාවක් තමයි බෞද්ධයන් පංචශීලය වශයෙන් සමාදන් වන්නේ.

## පන්සිල් බුදු දහමට අයත් වන්නේ කෙසේද?


අප බොහෝ දෙනෙක් අදහස් කරන අන්දමට පන්සිල් බෞද්ධයන්ට පමණක් සීමා වූවක් නොවෙයි. දුරාතීතයේ සිට වර්තමානය දක්වාම උතුම් මිනිසත් බවේ උත්තරීතරත්ව රැක ගනිමින් ජීවත් වූ සහ ජීවත් වන බෞද්ධයන් සේම, අබෞද්ධයන්ද මේ පංචශීලය ආරක්ෂා කළා විය හැකියි. නමුත් බෞද්ධයන් මේ පන්සිල් රකින්නේ ඊට වඩා ශ්‍රේෂ්ඨ අරමුණක් ඇතිවයි. එනම් ඔවුන්ගේ පංචශීල ප්‍රතිපදව බුදු දහමෙහි පමණක් දක්වෙන ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුළ පවත්නා වූ නිර්වාණගාමී ප්‍රතිපදවෙහි පදනම වීමයි.

ආර්ය අෂ්ඨාංගික මාර්ගය යන වදන තරමක් ගැඹුරු අරුතක් පළ කරන්නක් වුවද සිත, කය, වචනය තුන් දෙරෙහි දමනය හා සංයමය ඒ තැනැත්තා නිර්වාණය වෙත යොමු කෙරෙන අන්දමයි මෙහි සවිස්තරාත්මකව දක්වෙන්නේ. තමන් හටත්, අනුන් හටත් අනර්ථය පිණිස වන සියලුම සිතිවිලි, වදන් සහ ක්‍රියාවන්ගෙන් වැළකී, තමන් හටත්, අනුන් හටත් යහපත් අර්ථ චරියාවන්හි යෙදී සිත මනාව දමනය කරගත් කෙනකුට නිවන් මගට පිවිසීමට හැකි බවයි බෞද්ධ ඉගැන්වීම.

**පූජ්‍ය යටමලගල සුමනසාර හිමි - කැලණිය**



"පව් කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි."





# භාවනාවෙන් රෝග සුවකර ගත හැකිද?

පාසල් යන දරුවෝ විෂය කරුණු මතක තබා ගැනීමේ උපක්‍රමයක් ලෙස භාවනා කරති. අධිරුධිර පීඩනය, හෘද රෝග ආදියෙන් පෙළෙන වැඩිහිටි රෝගීන්ටද භාවනා කිරීම ඉතා යහපත් දෙයක් ලෙස වෛද්‍යවරු පවා උපදෙස් දෙති. තවත් අය තමන්ගේ යම් යම් පෞද්ගලික අභිමතාර්ථ ඉටුකර ගැනීම සඳහාත් භාවනාවෙහි යෙදෙනු දක්නට ලැබේ.

මේ අනුව බලන විට භාවනාවෙහි යෙදෙන හැම දෙනාටම ඇත්තේ, ඒ හා බැඳුණු බලාපොරොත්තු හා ප්‍රාර්ථනාවන්ය. එයින් පැහැදිලි වන්නේ, භාවනා කරන බොහෝ දෙනා එහි මූලික හරය හඳුනාගෙන නැති බවයි.

**බෞද්ධ භාවනාවේ මූලික හරය කුමක්ද?**

1. සිත පිරිසිදු කිරීම
2. ශෝක පරිදේවයන් දුරු කිරීම
3. දුක් දොම්නස් නැතිකර දැමීම
4. සත්‍ය අවබෝධය
5. ඉහත කී සියල්ලෙහි අවසන් ප්‍රතිඵලය වන නිවන සාක්ෂාත් කරගැනීම.

නමුත් නිවන සාක්ෂාත් කරගැනීම පසෙකලා බොහෝ දෙනකු භාවනා කරන්නේ ඉහත කී පරිදි ලෞකික පරමාර්ථ මුදුන්පත් කරගැනීම උදෙසාය. සුළු මානසික කම්පනයක් ඇති වුවත් ඉන් මිදීම සඳහා බොහෝ දෙනා භාවනා කරන්නට පෙළඹෙන්නේ මේ නිසාය.

එක අතකට මෙහි වරදක් නැත. නමුත් ඒ වෙනුවෙන්ම සිත භාවනා කරන්නට අවශ්‍ය වන්නේද නැත. මෙය තවත් පැහැදිලි කරගන්නට අපි උදහරණයක් ගනිමු. බත් පිඟානක් කන තැනැත්තකු ''මගේ කුස පිරේවා පිරේවා'' ආදී වශයෙන් ප්‍රාර්ථනා කිරීම අවශ්‍ය නොවේ. ඔහු බත් කන නිසා එසේ ප්‍රාර්ථනා කළත් නැතත් කුස පිරීම සිදුවෙයි. එමෙන්ම භාවනාව නිසි ලෙස කරන විට යහපත් ප්‍රතිඵල ඉබේම අත්වනු ඇත.

සිත පිරිසිදු වීම, ලෙඩ රෝග සුව වීම, විභාග සමත් වීම සඳහා මනස නිරවුල්ව පවත්වා ගැනීම, පෞරුෂ වර්ධනය, එදිනෙදා ජීවිතයේ දියුණුව, සැනසුම යන මේ ඕනෑම දෙයක් වෙනුවෙන් භාවනා කිරීම සෘජුව ප්‍රතික්ෂේප කළ නොහැකි වන්නේ භාවනාවෙන් කුසල සිතිවිලි වැඩෙන නිසාය. නමුත් ලෞකික ප්‍රතිඵල අපේක්ෂාවෙන් පමණක් කරන භාවනාව බුදු දහමින් අනුමත නොවේ. ඊට හේතුව, එමගින් තණ්හාව වැඩි වීමය. නිදසුනක් ලෙස ඔබ රූමත් වන්නට සිතාගෙන දිනපතා භාවනාවේ යෙදෙන්නේ යැයි සිතමු. එයින් සිදුවන්නේ, ලස්සන වීමේ ඇල්ම දවසින් දවසම ඔබ තුළ වැඩි වීමය. එසේම, ඔබ බලාපොරොත්තු වන කාලසීමාවේදී ඔබ ලස්සන නොවුණහොත් ඔබ තුළ ඉතිරි වන්නේ දුක, කලකිරීම හා පසුතැවිල්ලයි. භාවනාවේ අදහස ලස්සන වීම නිසා, එතැන ඇත්තේ ආශාව නමැති අකුසල සිතිවිල්ලයි. එවිට භාවනාවෙන් නිසි ප්‍රතිඵල ලැබීම අසීරු වෙයි.

පාඩම් මතක තබාගැනීමේ අරමුණින් භාවනා කිරීමත් මෙවැන්නකි. එහිදී භාවනා කරන්නේ එමගින් බලාපොරොත්තු වන ප්‍රතිඵලය කෙරෙහිම සිත දැඩිව බැඳ තබමිනි. ඒ අනුව ලෝභ ආදී අකුසල කර්ම වැඩීම නොවැළැක්විය හැකිය. මෙහිදී මතකය වැඩි දියුණු කරගන්නට භාවනා කිරීම වරදක්දැයි කෙනකු විමසන්නට පුළුවන. එහි වරදක් නැත. නමුත් අරමුණ විය යුත්තේ පාඩම් මතක තබා ගැනීම නොව, සිත පිරිසිදු වීමය. එලෙස සිතා භාවනා වැඩිය යුතුය. සිත පිරිසිදු වීමේ ප්‍රතිඵලයක් ලෙස ඉබේම මතක ශක්තිය දියුණු වනු ඇත.

රුධිර පීඩනය ආදී රෝග නිවාරණය වන්නට භාවනාවෙන් ලොකු පිටිවහලක් සැලසෙන බව ලෝකය පුරා දැන් පිළිගෙන තිබේ. භාවනාවෙන් සිදුවන්නේ සිත පිරිසිදු වීමය. එවිට ලේ ධාතුවද පිරිසිදු වේ. ලේ ධාතුව පිරිසිදු වන විට ප්‍රතිශක්තිකරණය වැඩි වනු ඇත. ප්‍රතිශක්තිකරණය වැඩිවීම තුළින් රෝගවල ශක්තිය හීන වෙයි.

''අනුන්ගේ රළු පරළු කතාත් අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතුය. තමාගේම කළ නොකළ දේ සෙවිය යුතුය.''


භාවනාව ලෙඩ සුව කරන ප්‍රබල ඖෂධයක් බඳු වුවත් බුදුරජාණන් වහන්සේ අගය කළේ භාවනාවෙන් මනස ලෙඩ කරන රෝග කාරක විෂබීජ වන කෙලෙස් දුරුකර ගැනීමය. ලෝභ, ද්වේෂ, මෝහ වැනි කෙලෙස්වලින් සිත පිරුණු විට රෝගී වන්නේ ඉබේමය. මේ රෝග කාරක විෂබීජ පලවා හැරියොත් බොහෝ රෝගවලින් මිදීමේ හැකියාව ලැබේ.

මනස ලෙඩ කරන රෝග කාරක බොහෝය. ඒවාට නිසි කර්මස්ථාන තෝරාගෙන භාවනා කිරීමෙන් මේ රෝග කාරක විෂබීජ දුරුකර ගැනීම අසීරු නොවේ.

රාගය නිසා දැවෙන සිතක් ඇති කෙනකුට සුදුසු කර්මස්ථානය වන්නේ **අසුභානුස්සති භාවනාවය**. එකක් කී විට ඒ ඔස්සේම යමින් කල්පනා කරන (විතර්ක බහුල) අයට **ආනාපානසති භාවනාව** ගැළපෙන කර්මස්ථානය වේ. නිතර තරහා යන අයට **මෛත්‍රී භාවනාවද**, විචිකිච්ඡා (තෙරුවන් ගැන සැකය) බහුල නම් **බුද්ධානුස්සති භාවනාවද**, නිතර අනෙක් අය ගැන සැක ඇත්නම් ආනාපානසති භාවනාව සුදුස් කර්මස්ථාන ලෙස දැක්විය හැකිය. මේ ආකාරයට අපේ සිත කිළිටි කරන රෝග කාරකවලට ගැළපෙන කර්මස්ථාන යොදාගෙන භාවනා කිරීමෙන් එම රෝගකාරක විෂබීජ පළවා හැර සිත සුවපත් කර ගැනීමට පුළුවන.

නිරෝගී මනසක් තිබීම මෙලොව පරලොව දෙකම සුවපත් වීම සඳහා ඉතා වැදගත් වෙයි. තත්ත්වය මෙසේ වුවත් විවිධ ලෞකික අභිමතාර්ථ වෙනුවෙන් භාවනා කිරීම වරදක් ලෙස ඉවත දමන්නට නොහැකිය. එහිදී කළ යුතු වන්නේ ලෞකික සැපය හේතුවක් කරගෙන භාවනාවට පිවිස ලෝකෝත්තර සැපය සලසා ගැනීම සඳහා භාවනාව යොදා ගැනීමය. භාවනාව අවංක සිතින් කරන විට සිතට සුවයක් දැනේ. එය පදනම් කරගෙන අකුසල් සිතිවිලි දුරු කරගෙන කුසල් සිතිවිලි දියුණු කරගැනීමට සිත යොමු කළ යුතුය.

**පූජ්‍ය තලල්ලේ චන්දකිත්ති හිමි**





# අහංකාර වුණොත් මෙන්න ප්‍රතිඵල

සුබ මානවකතුමා බුදුරජාණන් වහන්සේගෙන් විමසුවා ''ස්වාමීනි බුදුරජාණන් වහන්ස, මේ මනුෂ්‍ය ලෝකයේ ඇතැම් මනුෂ්‍යයන් ඉතාම නින්දිත පහත් කුලවල උපදිනවා. එසේ ඉපදීමට හේතුව කුමක්ද?'' කියා. බුදුරජාණන් වහන්සේ එතුමාට පිළිතුරු දුන්නා.

''තරුණය, මේ ලෝකයේ ඇතැම් අය මාන්නයෙන් උද්දමයට පත්වී, මාන්නයෙන් උමතු භාවයට පත්වී හැම තැනකදීම තමා උසස් කොට හුවා දකිමින්, අන් අය පහත් කොට හෙළා දකිමින් කටයුතු කරනවා. එසේ මාන්නය අධික පුද්ගලයන් ඒ මාන්නය නිසා වැඳිය යුතු බුදු, පසේ බුදු, මහ රහතන් වහන්සේලාටත්, මහා සංඝයාටත්, මව්පියන්ටත්, ගුරු උතුමන්ටත්, වයෝවෘද්ධ, තපෝවෘද්ධ, ගුණවෘද්ධ උතුමන් හට ගරු කරන්නේ නැහැ. පිදිය යුතු උතුමන්ට ආසන දෙන්නේ නැහැ. මග ඉඩදිය යුතු උතුමන් හට මග ඉඩ දෙන්නේ නැහැ. මේ ආකාරයට හැමවිටම තමා උසස් කොට දක්වමින් අන් අය පහත් කොට සලකන මාන්නය අධික පුද්ගලයන් ඒ පාපයේ හේතුවෙන් මරණින් මතු අපායට පත්වන අතර යම් කාලයකදී මනුලොව උපන්නාම ඒ අකුසල කර්මයේ හේතුවෙන් උපනූපන් ජාතීන් හිදී ඒ ඒ කාලවලට පහත් යැයි සම්මත නින්දිත පහත් කුලවල උපදිනවා.''


(චූල්ලකම්ම විභංග සූත්‍රය, මජ්ඣිම නිකාය)

**මොරගොල්ලේ සුමනයෝගි හිමි**

''මෝඩයා මට දරුවෝ ඇත. මට ධනය ඇත කියා සිතමින් උද්දම වෙයි. තමාට තමනුත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?''

# ඔබත් උපාසක චණ්ඩාලයෙක්ද?

අපේ බෞද්ධ සමාජය දෙස බලන විට පෙනෙන්නේ එම සමාජය තුළ උපාසක උපාසිකාවන් හිඟ බවකි. නමුත් උපාසක උපාසික චණ්ඩාලයන් පමණට වඩා සිටින බවකි. ධර්මය කවදක හෝ අතුරුදන් වන්නේ අවස්ථාවාදී ධර්මධර ධර්මාරක්ෂකයන් නිසා බව බුදු දහමෙහි සඳහන් වෙයි. වැටත් නියරත් ගොයම් කන විට එම අවනඩුව කියන්නට කෙනෙක් නැහැ යන්න වගෙයි. අද බොහෝ සිද්ධි අධ්‍යයනය කර බලන විට දක්නට ලැබෙන්නේ එයයි.



එක දවසක් බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් නුවර නීග්‍රෝධාරාමයේ වැඩ වාසය කරන විට මහානාම නමැති ශාක්‍ය කුලයට අයත් පුද්ගලයෙක් උන්වහන්සේ හමුවට පැමිණියේය. පැමිණ බුදුහිමියන්ට වැඳ ප්‍රශ්නයක් විමසා සිටියේය. ඔහුගේ ප්‍රශ්නය මෙසේය.

"හිමියනි, උපාසකයෙක් වන්නේ කොහොමද?" යනුයි. බුදුහිමියන්ගේ පිළිතුර වූයේ තෙරුවන් සරණ ගිය පුද්ගලයා, උපාසක යන නමින් හැඳින්විය හැකි බවයි. (අං: නි 5, මහානාම සූත්‍රය, පිටුව 120) තෙරුවන් සරණ යාම යනු සරණ යාම සහ අනුගමනය කිරීම යන අංශ දෙකටමය.

බුදු දහමෙහි උපාසක යන ප්‍රදනය දී ඇත්තේ තෙරුවන් සරණ යාම සඳහා නිසා ඒ අරුතින් වෙනත් ආගම දහමක උපාසකයන් සිටිය නොහැකිය. ඇතැම් අවස්ථාවල දක්නට ලැබෙනුයේ බෞද්ධ ආගමික පරිසරයේ භාවිත වන වචන වෙනත් ආගමිකයන්ද භාවිත කරන බවයි. එය වැරදිය.

තෙරුවන් සරණ ගිය පුද්ගලයා උපාසක නම් වෙයි. සංසරත්නය පහළ වී නොමැති කල්හි බුද්ධ, ධම්ම සරණ ගිය උපාසකවරු වැටෙන්නේ ද්විවාචික උපාසක යන්නටයි. තෙරුවන් සරණ යාම තුළද ගැඹුරු අරුතක් පිහිටා තිබේ. නමුත් ත්‍රිවිධ රත්නයට හිස නමන ඕනෑම කෙනකුට බෞද්ධයකු බවට පත්විය හැකිය. තෙරුවන් සරණ නොගිය බෞද්ධයෝද සිටිති. ඒ වර්තමාන ලංකාවේය. බුදු සමයේ එබඳු මගක් කියා නැති තෙරුවනට ගරු නොකරන බොහෝ ගිහි බෞද්ධ උගතුන්ද, භික්ෂූන් සිටිති. ඔවුන් බෞද්ධ ලේබලය අලවාගෙන විවිධ විෂමාචාරවල යෙදෙති. වෙනත් ලාභ ප්‍රයෝජන සඳහා බෞද්ධ නම භාවිත කරති. නිවැරදි බෞද්ධ මග හා ධර්මයේ රාජ්‍ය තන්ත්‍ර සොයාගෙන පාර්ලිමේන්තු ගියාහුද මේ රටේ සිටිති.


මෙබඳු අය උපාසක යන උතුම් නමින් හැඳින්විය නොහැකිය. උපාසකයෙක් නම් තෙරුවන් සරණ යා යුතුම වන අතර තෙරුවන් සරණ ගිය හැම කෙනකුම උපාසක යන නමින් හැඳින්විය නොහැකි බව පෙනෙයි. උපාසක සහ උපාසක චණ්ඩාලයා යන තත්ත්වයට පැමිණෙන්නේ උපාසකයාගේ තුන්දෙර ක්‍රියාත්මක වීම අනුවයි. එය පැහැදිලි කරනු ලබනනේ උපාසක චණ්ඩාල සූත්‍රයේදීය.

මහණෙනි කරුණු පහකින් යුක්ත වූ උපාසක තෙමේ උපාසක චණ්ඩාලයෙක්ද, උපාසක මලයෙක්ද, උපාසක හීනයෙක්ද වෙයි. කවර අංග පහකින්ද යත්, 1. ශ්‍රද්ධාව නැති කෙනෙක් වෙයි, 2. දුශ්ශීලයෙක් වෙයි, 3. අසන දකින හොඳ නරක දෙකින් සුබාසුබ සිද්ධි වෙතැයි පිළිගන්නේ වෙයි, 4. කර්මය

"යමක් කොට පසුතැවෙන්නට වේද යමක විපාකය කඳුළු පිරි මුහුණෙන් යුක්තව හඬමින් විඳින්නට සිදුවේ."

නොසලකන්නේ වෙයි, 5. බුදු සසුනෙන් පිටත පින් පිණිස දීමට සුදුස්සෙක් සොයයි. කෙනෙක් උපාසක චණ්ඩාලයකු වීමට මෙම කරුණු ප්‍රමාණවත්ය.

මේ බව පැහැදිලි කරනු ලැබ ඇත්තේ සසුනටද, භික්ෂූන්ටද සෙනෙහස දක්වන්නා වූ ලෙස හිඳිනා මිථ්‍යා දෘෂ්ටිකයන් හඳුනා ගැනීමට විය හැකිය. පිටතින් එකක්ද, අභ්‍යන්තරයෙන් හාත්පසින්ම වෙනස් වූ ක්‍රියාදාමයක්ද අනුගමනය කරනු ලබන අය සමාජයේ හමුවෙයි. වෙනත් භික්ෂූන් වහන්සේලාගේ ගුණ කියමින් පන්සලේ වැඩ වසන හිමියන්ට බැණ වදියි. දෙස් නගයි. කිසිවකුගේ ගුණ වනන්නේ වෙනත් කෙනකුට පහරදීම සඳහායි. ක්‍රියාවෙන් අරමුණ කුමන්දැයි හෙළිවෙයි. මේ සියල්ලටම හේතුව ශ්‍රද්ධාව නැතිකමයි. ශ්‍රද්ධාව යනු බුදුරජාණන් වහන්සේ හා



ධර්මය පිළිබඳ ඇතිකරගනු ලැබූ භක්තිය හෙවත් පැහැදීමයි. උපාසක කෙනකුට දෙස් නගන්නේ තම පැහැදීම සහිත මනසින්ද, නැත්නම් වෙනත් අරමුණක් සඳහාද යන්න ඔහු විසින්ම තීරණය කළ යුතු වෙයි. ඇතැම් අය තමන්ගේ සිතෙහි ආගම ඉතා මැනවින් තිබෙන නිසා බුදුන් වැඳීම වැනි බාහිර බොරු දේවල් අවශ්‍ය නැතැයි කියති. මෙම කියමනෙන්ම කපටි සිතුවිල්ල හෙළි වෙයි. බාහිර ක්‍රියාදාමයෙහි නැති ආගම ක්‍රියාවට පමණක් පවතින්නේ කෙසේද? කවදාකවත් බුදුන් නොවඳින කෙනෙක් ආගම දහමට අනුව ජීවත් වන බව කීමෙන් එය පිළිගත හැකිද? බොහෝ බෞද්ධ උගතුන් තුළ දකින්නට ලැබෙන ශ්‍රද්ධාව මවා ගත් එකකි. හදවතේ ශ්‍රද්ධාව නැත. උපැවිදි වූ ඇතැම් ගිහින් උගතුන් තුළද මෙම ක්‍රමය ක්‍රියාත්මක වෙයි. බුදු මැදුරු වෙනම හදගෙන නිතර වැඳුම් පිදුම් කරන බව සමාජයට අඟවති. තමා හරිම ශ්‍රද්ධා සම්පන්න කෙනකු බව අඟවති.

දුස්සීලයකු ලෙස හැඳින්වූයේ කය වචන දෙකෙහි සංවරය පිළිබඳවයි. එම ස්වභාවය තමා තුළ පවතීද, නැතිද යනුවෙන් මැනවින් දන්නේ තමා විසින්මය. සිත, කය හා වචනය පිළිබඳව යහපත් පිහිටීමක් හොඳ උපාසකයකු සතුව පැවතිය යුතු බව හෙළිවෙයි.

තමා තමාගේ උපාසක බව හෙවත් ආගමික තත්ත්වයට භාවිත කරගන්නේ කුමන අරමුණක් සඳහාද යන්න නිතර දෙවේලේ විමසා බැලීම වැදගත්ය. උපාසක චණ්ඩාලයකු නොවී උපාසක පද්මහක් හෝ පුණ්ඩරීකයක් බවට පත්වීම සඳහා එය හේතු භූත වෙයි. ජීවත් වෙනවා නම් විය යුතු වන්නේ එබඳු කෙනකු බවට පත්වීමය. එසේ නැතිව ගත කරනු ලබන උපාසක ජීවිතය සසරින් මිදීම පිණිස හේතු නොවෙයි. එය තමාගේ ලාභය සහ වාසිය පිණිස පමණක් හේතු වෙයි. සසර ගමන සඳහා හෝ නිවන් සඳහා හේතු නොවෙයි.

පිරිසිදු මනස හා තමා කරන කියන දෙය අනුව යහපතද, අර්ථයද සැපයෙයි. එය බුදු සමය පිළිගත් මතයය. නමුත් උපාසක චණ්ඩාලයා එය එසේ පිළිගනු ලබන්නේ නැත. අසන දකින 'දේවලින් හොඳ නරක සිදුවෙයි යන මතය පිළිගනියි. එය බුදු සමයට පටහැණි ක්‍රියාවකි. එය එද සමාජයේ පුද්ගල දියුණුව සැලසේ යැයි සිතා වැරදි ප්‍රශ්නයක් බුදු සමය පිළිගනු ලබන්නේ පුද්ගලයාගේ ක්‍රියාව මත සුබාසුබ ලෙස සිදුවන බවයි. අර්ථවත් ලෙස කල්පනා කොට යමක් කළ පසු අර්ථය සැලසෙයි. මෙසේ පුද්ගල මානසික සිතිවිලි අනුව සිදු වන්නකි. පුද්ගලයාට මනසට ආ සිතුවිලි නැගෙන්නේ ඔහුගේ ක්‍රියාදාම පද්ධතිය අනුවය. උපාසක චණ්ඩාලයාගේ අනෙක් ක්‍රමය වන්නේ කර්මය නොසලකා කටයුතු කරන්නෙක් වීමය. කර්මය අදට සිදුවන ක්‍රමය මනසින් ඉවත් කිරීම දහමෙන් ඉවත් වීමත් බෞද්ධ උපාසකයකුගේ කර්ම රූපයට සිදුවන ක්‍රියාදාමයන් පිළිගත යුතු වෙයි. තමා ඇසූ දුටු කල්පනා වූ සෑම ක්‍රියාදාමයකටම අනුව නොව කර්මානුරූපව සියලු කටයුතු සිදුවෙයි. මෙම පිළිගැනීම කළ යුතුය.

බුදු සමයෙන් පිටත වෙනත් වඩාත්ම දීමට සුදුසු අය සොයා විමසා බැලීමද එතරම් සුදුසු ක්‍රියාදාමයක් නොවේ. සසුන ඇතුළත වටිනා අයට වඩා ශීලයෙන්, ගුණයෙන් සර්ව සම්පූර්ණ වූ අය හෝ එසේ නොවන අය සමාජයේ සිටිය හැකි වුවද තමා පිළිගත් දහම ඉක්මවා ප්‍රතිරූප වන්දන මේ හැම බෞද්ධ උපාසකයකුට තරම් නොවන බව දක්වා තිබේ.

**මහාචාර්ය පාතේගම ඥාණිස්සර හිමි**

''දෙවූ වහාම කිරි නොමිදෙන්නාක් මෙන් කෙනෙකු විසින් කරන ලද පව වහා නොමෝරයි. එය අළු යට වූ ගිනි පුපුරක් මෙන් ඔහු දවමින් පසුපස ලුහු බඳී.'



# කළ පව් තමා පසුපස 'ම' එයි



දේශකයාණෝ : ශ්‍යාමෝපාලි මහානිකායේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ විංශද්වර්ගික කාරක සංඝ සභික


**පූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ මේධංකර**
තේවාවහාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

"මනොපුබ්බංගමා ධම්මා
මනොසෙට්ඨා මනොමයා
මනසා චෙ පදුට්ඨෙන
භාසති වා කරොති වා
තතො නං දුක්ඛමන්වෙති
චක්කංව වහතො පදං"

පින්වත්නි,

කුසලාකුසල ධර්මයෝ සිත පෙරටු කොට ඇත්තාහුය. සිත ප්‍රධාන කොට ඇත්තාහුය. සිතින් උපන්නාහුය. යමෙක් අපිරිසිදු සිතින් ක්‍රියා කෙරේ නම් නපුරු වචන කියා නම් ඒ හේතුකොට දුක ඔහු පසුපස්සේ ගමන් කරයි. කරත්තයේ බැඳි ගොනාගේ පය රෝදය අනුව යන්නාක් මෙනි. අකුසල ධර්මයට හිත මුල් වේ. කිලිටි

''තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය.''



වූ සිතින් අකුසල් කළ තැනැත්තා පසුපස්සේ දුක ලුහුබඳී. පුද්ගලයෙකුගේ කර්මානුරූප භවගමන සිදුකර ගන්නේ කර්ම විපාකය අනුවය. අපිරිසිදු මනසින් යමක් කියයි නම් කරයි නම් ඒ පුද්ගලයා කළ කර්මය ඔහුට පීඩා දෙමින් ඔහු පසුපස ගමන් කරයි. ගවයා පසුපස යන රිය සක මෙන් ඔහු කරන නරක ක්‍රියා ද ඔහු පසුපස ගමන් කරයි.

"මනසා චෙ පසනෙනන
භාසති වා කරොති වා
තතො නං සුඛමන්වෙති
ඡායාව අනපායිනී"

යමෙක් යහපත් සිතින් ක්‍රියා කරයි නම් යහපත් වචන කියයි නම් ඒ හේතු කොට සැපය ඔහු අනුව යයි. තමාගේ සෙවනැල්ල තමා අත් නොහැර තමාගේ පසුපස යන්නාක් මෙනි.

පුද්ගලයෙකු පිරිසිදු සිතින් යහපත් ක්‍රියාවක් කරයි නම් එම ක්‍රියාව ද ඔහු පසුපස සෙවනැල්ල මෙන් සැප විපාක ගෙන දෙයි. එක්තරා බ්‍රාහ්මණයෙක් "කෙනෙකු දීර්ඝායුෂ ඇත්තා වූද තවත් කෙනෙකු අල්පායුෂ ඇත්තා වූ ද වෙයි. ඇතැම්හු රෝගී වූවෝ වෙති. ඇතැම්හු නිරෝගී වූවෝ වෙති. ඇතැම්හු රූප සම්පන්නයහ. ඇතැම්හු විරූපී වෙති. ඇතමුන් බලවතුන් වෙයි. කෙනෙකු දිළින්දෙකු වන අතර තවත් කෙනෙකු ධනවතෙකු වෙයි. ඇතැමුන් කුලවතුන් වන අතර තවත් සමහරු කුල හීනයෝ වෙති. තවත් සමහරු බුද්ධිමතුන් වන අතර සමහරු අඥානයෝ ලෙස විද්‍යාමාන වෙති. මනුස්සයන් අතර මෙසේ උස්මිටිකම් ඇතිවීමට හේතුව කුමක්දැයි බුදුරජාණන්වහන්සේගෙන් විමසූ විට සත්ත්වයෝ ස්වකීය කර්මය උරුම කොට ඇත්තාහ. කර්මය ඔවුන් බිහි කරන මවු කුසය. කර්මය ඔවුන්ගේ ඥාතිවරයා හා පිළිසරණද වන්නේය. එබැවින් කර්මය උස් පහත් වශයෙන් බෙදෙන්නේය යනුවෙන් වදාළ සේක".

ප්‍රාණඝාතය, අදත්ථාදානය, කාමමිත්‍යාචාරය, මුසාවාදය, පරුෂ වචනය, සම්ප්‍රප්ප්‍රලාපාදිය නිතර පුරුදු කිරීම හා භාවිතය නිසා සත්ත්වයෝ තිරිසන් යෝනි වල හෝ අපායෙහි හෝ උත්පත්තිය ලබතියි වදාළ සේක. තවද කෲරව ප්‍රාණඝාතය කරන්නාවූ අය නරකයෙහි ඉපදෙති. මිනිස් ලොව උපන්නද මද ආයුෂ ලබති. සත්ත්වයින්ට වද හිංසා කරන්නෝ මිනිස් ලොව ඉපදුණු විට රෝග බහුල වූවෝ වෙති. ද්වේෂ කරන්නෝ විරූපී වෙති. ඊර්ෂ්‍යා කරන්නෝ අනුන්ගේ සැලකිලි නොලබති. මුරණ්ඩු අය පහත් තත්ත්වයෙහි ද කුසීතයා අඥානවන්තවද උපදිති.

කුසල් කරන්නෝ දිව්‍ය ලෝක වල මනුෂ්‍ය ලෝක වල උපදිති. නිරෝගීව, රූප සම්පන්නව, ධන සම්පන්නව, බලසම්පන්නව උපදිති. සියලු සත්ත්වයන් හා ස්වභාවධර්මය තුළ දක්නට ලැබෙන වෙනස්කම් බුදු දහමට අනුව කර්ම විපාක අනුව සිදුවන්නකි. කුණු වූ අඹ ඇටයකින් නිරෝගී රසවත් අඹ ඵලදාවක් ඇති සරුසාර අඹ ගසක් හට නොග න්නාක් මෙන් පාප චේතනාවෙන් හෙවත් පෙර කරන ලද අකුසල කර්ම නිසා දුකම ලැබෙන බවත් බුදු දහමට අනුව දත යුතුය.

චක්ඛුපාල රහතන්වහන්සේගේ කථාවෙන් කළ කම් පළදෙන ආකාරය මනාව ප්‍රකට වෙයි. පෙර අත්බවෙක චක්ඛුපාල තෙරුනුවෝ ඉතා දක්ෂ ඇස් වෙදදුරෙක් වූහ. එකල ඇස් රෝගයකින් පෙළෙන ගැහැනියක් ඒ වෙදදුරු ලවා ඇස් වලට බෙහෙත් කරවා ගත්තාය. ඒ ගැහැනිය ලෙඩේ සුව වූ නමුත් මසුරුව කිසිවක් වෙදදුරාට නොදෙන අදහසින් සුව නොවූ බව අඟවා වෙදදුරා රැවටූවාය. එම තැනැත්තිය කළ රැවටිල්ල දැනගත් වෙදදුරු කිලිටි සිතින් වැඩි සුව පිණිස යැයි කියා විෂ යෙදූ බෙහෙතක් දී ඒ ගැහැනියගේ ඇස් දෙකම අන්ධ කළේය. ඒ පාපකර්මයේ විපාක වශයෙන් චක්ඛුපාල තෙරුන්වහන්සේගේ ඇස් අන්ධ විය. එහි විපාක රියසක පසුපස ගිය ගොනුගේ පා මෙන් වෙදදුරුව සිටි චක්ඛුපාල රහතන්වහන්සේ කෙරෙහිද සසර ගමනේ පසුපස පැමිණියේය.

එසේ ම පහන් සිතින් පින් කළ තැනැත්තන්ගේ පසුපස ද කුසල් දහම් ලුහුබඳී. සිතින් කයින් වචනයෙන් යන තිදොරින් සිදුවන කුසල් සැපතට හේතුවන බව මට්ටකුණ්ඩලී කථාවෙන් දත හැකිය. මට්ටකුණඩලී යනු සැවැත්නුවර ඉසුරුමත් බමුණෙකුගේ පුතෙකි. මේ බමුණා මසුරුකම නිසා තම පුත්‍රයාගේ කුණඩලාභරණය තමා විසින්ම සකස් කර දුන්නේ මටසිලුටු කමෙන් තොරව කටුක ලෙසටයි. මෙබඳු පලඳනාවක් දැරූ නිසා ඔහු නමින් මට්ටකුණ්ඩලී නම් විය. පුතුගේ නැණ නුවණ පහදන්නද කිසිම වියදමක් නොකළේය. මට්ටකුණ්ඩලී උගතෙක් නොවූවත් ගුණවතෙක් වීය. පවෙන් වැළකුනු කෙනෙක් විය. ඔහුට හරිහැටි කෑම බීම නොලැබුනෙන් ගිලන්ව බලවත් සේ රෝගාතුර වූ විටදී ඔහුගේ අවමඟුලට එන යන අය නිවසේ ධනය දකිතියි සිතා ගෙතුළෙන් ගෙනවිත් බරාඳයේ නිදි කරවූයේය. මොහුගේ අවසන් මොහොත ළඟා වූ විට බුදුරදුන් වැඩම කොට මට්ටකුණ්ඩලීට පෙනෙන් ලෙස වැඩ සිටි විට බුදුරදුන් දුටු මට්ටකුණ්ඩලීගේ සිත පැහැදුනේය. ලෙඩට බෙහෙත් නොමැතිව ඔහු කළුරිය කළත් අවසන් මොහොතේ බුදුන් දැක සිත පැහැදුනු බැවින් ඒ කුසල් සිතින් දෙව්ලොව උපන්හ. ඒ

"සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැස්විය යුතුය."

කරුණ අරහයා බුදුරජාණන්වහන්සේ "පහන් සිතින් කරන කුසල් පසුපස්සේ ලුහුබැඳ ගොස් සැප ලබාදෙන බව වදාළ සේක".


චක්ඛුපාල මට්ටකුණ්ඩලී කථා මෙන්ම අග්‍රශ්‍රාවක මහ මුගලන්, අංගුලිමාල යන මහරහතන් වහන්සේලාට ද අකුසල කර්ම විපාක දුන් අයුරු ධර්මයෙන් පැහැදිළි වෙයි. මුගලන් රහතන් වහනසේට තමන් වහන්සේ පෙර අත්භවයක දෙමව්පියන් මැරුවා වූ ආනන්තරීය කර්මයට විපාකයක් වශයෙන් අවීචිනරකයේ උපදවා අන්තිම ආත්මයෙහි සොරුන් විසින් පහර දී මරණ ලදහ. උන්වහන්සේ ඍද්ධිමතුන් අතරේ අග්‍ර වුවද කර්මය ඊට වඩා බලවත්ව විපාක දුනි. අංගුලිමාල මහරහතන්වහනසේට විපාක දෙනු ලැබුවේ ද එම ආත්මයේම කරන ලද මිනී මැරීමේ විපාකයි. උන්වහන්සේ එම ආත්මයේම රහත් වූ බැවින් නැවත ආත්මයක විපාක දීමට නොමැති බැවින් එම ආත්මයේදීම විපාක විඳීමට සිදුවිය. උන්වහන්සේ පිඬුසිඟා වඩින විට කාක්කෙකුට බල්ලෙකුට ගහන කැට කැබලිත්තක් හෝ වැදෙන්නේ අංගුලිමාල රහතන්වහන්සේටය. බොහෝ අවස්ථාවල උන්වහන්සේගේ පාත්‍රය බිඳී සිවුර ඉරී ගොස් හිසින් ලේ වැගිරෙමින් විහාරයට වැඩම කරති. මෙසේ රහත් වුවත් කළ පව් විඳීමට සිදුවී ඇත.

දෙවූ සැණෙකින් කිරි නොමිදෙයි. පවද කළ සැණෙකින් විපාක නොදෙයි. අලුවලින් වැසුනු ගින්න දවමින් එය පෑගුනු පුද්ගලයා වෙත පැමිණෙන්නාක් මෙන් අකුසලය ගිනි ජාලාවක් වී ගිනිජාලාව පෑගූ අය දවන්නාක් මෙන් පව් කළ අනුවණයාද දවමින් ලුහුබැඳ එයි. පව් කරන කලට මී පැණි මෙන් මිහිරිය. එහි විපාක විඳින කල්හි දුක් ඇඩි වේ. උපදෙස් දැනගෙන කය වචනය සිත යන තුන්දොරෙහි පාපයට අවකාශ නොදිය යුතුය. පව්කම් යම්තාක් විපාක නොදේද ඒ තාක් අඥානයා මීපැණිසේ සිතයි. විපාක දීමේදී දුකට පත්වෙයි. විපාක දෙන තෙක් කර්මයන්ගේ කටුක විපාක නොදනී. විපාක දීමේදී ගින්නෙන් දැවෙන්නෙකු මෙන් කායික චෛතසික සන්තාපයන්ගෙන් දැවේ. සීලයත් සමාධියත් විදර්ශණාවත් දියුණු කිරීමෙන් පව් දුරුකරගත හැකිය. පව් දුරු කරගන්නා ආකාරය තථාගතයන්වහන්සේගේ ධර්මයෙන් මනාව අවබෝධකරගත හැකිය. කය වචනය සිත සංවර කර ගැනීමෙන් පවින් වැලකිය හැකිය. යම්කිසි කර්මයක් ක්‍රියාත්මක වීමට සිතට අරමුණු වීමත් කිවූ දෙයක් හෝ කළ දෙයක් විය යුතුය.

ධම්මපදට්ට කථාවේ එන

"න අන්තලික්ඛෙ න සමුද්ද මජ්ඣ<br>
න පබ්බතානං විවරං පවිස්ස<br>
න විජ්ජතී සො ජගතිප්පදෙසො<br>
යත්ථට්ඨිතො මුඤ්චෙය්‍ය පාප කම්මා"

අහසේ සිටියත්, මහමුහුද මැද සිටියත්, ගිරිගුහාවක සැඟවී සිටියත් කර්ම විපාකයෙන් නිදහස් විය නොහැකි බවත් සසර ගමනේදී කවදා හෝ කොතැනකදී හෝ පාපකර්මයක් විපාක දිය හැකි බවත් දත යුතුය. සත්ත්ව ඝාතනය හෝ සතුන්ට හිරිහැර කිරීමෙන් අඩු වයසින් මිය යැමත් රෝග පීඩා අධික වීමත් සිදුවේ. එයින් වැලකුණු තැනැත්තා දීර්ඝායුෂ ලැබ නිරෝගීව ජීවත්වේ. කිසිවෙක් රෝග බහුල වේ නම් ඊර්ෂ්‍යාවෙන් යුක්ත නම් කෙනෙකුගේ ගරුසම්මාන සත්කාර නොඉවසානම් දුර්වර්ණය අල්පේශාක්‍ය වේ. යමෙකු දීමේ මැලි වේ නම් භෝග සම්පත්තියෙන් හීන වේ. දෙන තැනැත්තේ භෝග සම්පත් ඇත්තේ වෙයි. ගරු කටයුත්තන්ට ගරු නොකරන්නෝ හීන කුලයන්හි උපදිති. නිහතමානී තැනැත්තෝ උසස් කුල වල උපදිති. අස්වැන්න නෙලා ගත හැක්කේ වපුරන බීජයට අනුවයි. කර්මය අනුව විපාක ද



විඳිමට සිදුවේ. තිදොරින් සැප වේදනාවෙන්ම යුක්ත කර්මයක් කරන්නේ නම් සැපයක්ම විඳින්නේය. දුක් වේදනාවකින් දුක් වේදනාවක්ම උපදින්නේය. තමන් කරන හොඳ නරක දෙකේ විපාක වලින් කොටසක් මේ ආත්මයේදීම භුක්ති විඳීමට ලැබෙන බව අමතක නොකළ යුතුය. එවැන්නක් විපාක නොදේනම් පෙර කළ කුසල විපාකයන්ගේ බලයෙනි. පින් කිරීමට ප්‍රමාද නොවන්න. පින්කිරීමේ පසුබටවන්නා පවෙහි ඇලේ. පිනක් කරන්නේ නම් එය නැවත නැවත කළ යුතුය. පින් රැස් කිරීම සැපයට හේතුවකි. පව සුළු කොට නොසිතන්න. දිය බින්දු වැටීමෙන් කලය පිරෙන්නාක් මෙන් අඥානයා ද ටික ටික පව් රැස්වී පවින් පිරේ. අකුසලයන්ගේ විපාකයෙන් මිදීමේ තැනක් ලෝකයේ නැත. මාරයාගෙන් මිදිය හැකි තැනක් ලෝකයේ කොතැනකවත් නැත. එබැවින් කුසල් දහම් රැස්කොට සසර කෙටි කර ගැනීමට හැම දෙනා විසින් ම නොපමාව උත්සහ කළ යුතුය.

*තෙරුවන් සරණයි.*

"යම් තැනක සිට පවේ විපාකයෙන් මිදිය හැකිද එබඳු තැනක් අහසෙහිත් නැත. මුහුද මැදත් නැත. පර්වත කුහරයකවත් නැත. එබඳු බිම් පෙදෙසක් ලොව කොහේවත් ඇත්තේ නැත."



# භික්ෂූන් විෂයෙහි


## විනය පැනවීමේ අවශ්‍යතාවයක් මතු වුණේ ඇයි..?

ශ්‍රී ට වසර දෙදහස් පන්සිය අනූපහකට ප්‍රථම සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ පහළ වීමත් සමග බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදාය ලෝකයට බිහිවිය. සමකාලීන අන්‍ය ශ්‍රමණ සම්ප්‍රදායන්ට වඩා සුවිශේෂිත්වයක් මෙම බෞද්ධ සම්ප්‍රදාය සතු විය. ශාක්‍යපුත්‍ර ශ්‍රමණ නාමයෙන් හැඳින්වූ මෙම නව සම්ප්‍රදාය ආදර්ශයේ ප්‍රතිමූර්තිය විය. බ්‍රාහ්මණ ආධිපත්‍යය යටතේ දැඩි සමාජ පීඩනයකට මැදිව සිටි විශාල පිරිසක් මෙම නව සම්ප්‍රදාය නිසා මහත් සහනයක් හිමිකර ගත්හ. සමාජ පීඩනයට හසු නොවූවත් ලෞකික වශයෙන් සැපවත් දිවි පෙවෙතක් ගත කළ මධ්‍යම පාන්තික හා රදළ ධනපති පැළැන්තියේ වූවෝද ඔවුන් විසින් මෙතෙක් අනාවරණය නොකර ගෙන තිබූ ප්‍රථම වරට බෞද්ධ සම්ප්‍රදාය විසින් අනාවරණය කර දෙන ලද ලොව්තුරු සුබාන්වේෂණය පිණිස මෙම අභිනව බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදාය හා එක්වූහ. කුශාග්‍ර බුද්ධිමත්හුද රැසක් ඔවුන්ගේ දෘෂ්ටීන් මිථ්‍යාවන් බව වටහාගෙන මෙම නව චින්තන සම්ප්‍රදාය හා එක්වූහ. මෙහිදී විශේෂයෙන් දැකිය හැකි ලක්ෂණයක් තිබේ. එනම්, කවර කුලයකින්, කවර තරාතිරමකින් කවරකු මේ නව බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදාය හා එක්රැස් වුවත් ඒ සම්ප්‍රදාය තුළදී ඒ කිසිවක් සැලකිල්ලට අල්පමාත්‍ර වශයෙන් හෝ සැලකිල්ලට ලක් නොවීමයි.

ඔව්හු සියල්ලෝ පෙර නාමගෝත්‍ර තරාතිරම් සියල්ලක් අතහැර එම ''ශ්‍රමණ ශාක්‍යපුත්‍ර'' නාමයෙන් හැඳින්වූහ. යම් සේ ගංගා, යමුනා, අචිරවතී සරභූ, මහී ආදී ගංගාවක් ගලාවිත් මුහුදට පැමිණ එකම ලුණු රසය ගන්නා සේ විවිධ කුල ගෝත්‍රවලින් මේ සම්ප්‍රදායට පැමිණියෝ ඒ මුල්නාම සියල්ලක් අතහැර එම ශාක්‍යපුත්‍ර නාමය හිමිකර ගත්හ. එකම නිවන් සුවය සෙවීමෙහි නියුක්ත වූවෝ වූහ. කළ යුතු කාර්ය පිළිබඳ සිහිගැන්වීම පමණයි ඒ ශ්‍රාවකයන් වෙනුවෙන් බුදුරජාණන් වහන්සේට කළ යුතුව පැවතියේ.

මෙම නව බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදායට පිවිසි පිරිමි පක්ෂය භික්ෂු නමින්ද, ස්ත්‍රී පක්ෂය භික්ෂුණී නමින්ද හැඳින්විණි. මේ පිරිස පැවිදිව එකම නිවන් මග ඉලක්ක කොටගෙන වාසය කළ නිසා ඔබ විසින් රැකිය යුතු ශික්ෂා මේවාය, නොකැඩිය යුත්තේ මේ ශික්ෂාවන් යැයි බුදුරජාණන් වහන්සේට පහද දීමේ අවශ්‍යතාවක්

''යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි.''



පැන නැගී බවක් නොපෙනේ. එසේම මහණ උපසම්පදව ලැබීමෙන් කෙබඳු ප්‍රතිපත්ති අනුග මනය කළ යුතු දැයි පැහැදිලි නියමයක් නොපැවතුණි. ඉමහත් ශ්‍රද්ධාවෙන් යුක්ත වූවෝ බුදුන්, දහම්, සඟුන් සරණ යෑමෙන් මහණ උපසම්පදව හිමිකර ගත්හ. ඔව්හු සත්සුන් ඉඳුරන්ගෙන් යුතුව වාසය කළහ. නිවන සාක්ෂාත් කරණයෙහි අදාළ මගෙහි ගමන් කළහ. නිවන සාක්ෂාත් කළෝ සමාජ ශෝධනයෙහි නියැලුණහ. ඒ සඳහා බුදුරජාණන් වහන්සේ සිය ශ්‍රාවකයන් මෙහෙයවූහ.

එහෙත් පසුකාලීනව මේ බෞද්ධ සම්ප්‍රදයට පිවිසි ඇතැම්හු තම මූලික පරමාර්ථයෙන් බැහැරට අන්‍ය අපේක්ෂාවෙන් යුතුව මෙම සම්ප්‍රදයට පිවිස ඇති බව හෝ මූලික පරමාර්ථයෙන් පිවිස පසුව ඒ පරමාර්ථය පසෙක ලා වෙනත් යම් යම් අපේක්ෂාවන් මත ක්‍රියා කර ඇති බව ඇතැම් චරිත පිළිබඳ විමසීමේදී පැහැදිලි වේ. දේවදත්ත, සුනක්ඛත්ත, සුදින්න වැනි චරිත ඒ අතර වේ. වරෙක බුදුරජාණන් වහන්සේ භික්ෂුන් අමතමින් තමන් වහන්සේට පෙර භික්ෂූන් වහන්සේලා ඒකාන්තයෙන්ම සිත් ගත් බව ප්‍රකාශ කොට ඇත. එම භික්ෂූන් වහන්සේලාට සිහිකරදීම පමණක් ප්‍රමාණවත් වූ බවත් අනුශාසනා කිරීමේ අවශ්‍යතාවක් ඇති නොවුණ බවත් පෙන්වා දී ඇත. එයින් පැහැදිලි වන්නේ පසුකාලීනව භික්ෂූන් වහන්සේලාට තමන් වහන්සේ පෙන්වා දුන් ඒකායන මාර්ගයෙන් පරිබාහිරව ක්‍රියා කරන්නට වීම බව සිතාගත හැකිය.

බුදුරජාණන් වහන්සේ මිගාරමාතු ප්‍රාසාදයෙහි වැඩ සිටියදී රැස්වූ භික්ෂූන් අතර ජිද්‍රශීල ඇති ළාමක ස්වභාව ඇති අපිරිසිදු වූ සැක කටයුතු හැසිරීම් ඇති වැසුණු ක්‍රියා ඇති අශ්‍රමණව ශ්‍රමණ ප්‍රතිඥ කරන එහෙත් බඹසරක් නැති චිත්ත්‍යාභ්‍යන්තරයෙහි කුණු පිරුණු කෙලෙසින් තෙත් වූ කසම්බුජාත අභව්‍ය භික්ෂුවක නිසා බුදුරජාණන් වහන්සේ පොහෝ කිරීමෙන් පාපොක් උදෙසීමෙන් වැළකුණු සේක. ''මහණෙනි, තථාගත තෙමේ නොපිරිසිදු පිරිසෙහි පොහෝ කරන්නේය. පාමොක් උදෙසන්නේ යන යමක් ඇද්ද මෙය නොකරුණකි, වන්නට අවකාශ නැත්තෙකි'' යනුවෙන් වදරා භික්ෂූන්ටම එම කාර්යය පැවරූ සේක. එතෙක් බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ට ශික්ෂා පනවා නොතිබුණි.

දිනක් ශාරිපුත්‍ර මහරහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේ වේරඤ්ජවෙහි වැඩ වසන සමයෙහි ශාසන චිරස්ථිතිය පිණිස භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවක පිරිසට විනය ශික්ෂා පද පනවන ලෙසට ඉල්ලා සිටියහ. එහෙත් ආසවට්ඨානිය (ආශ්‍රවයන් පහළවීමට ඉවහල් වන) ධර්ම පහළ වන තෙක් තමන් වහන්සේ ශික්ෂා පද නොපනවන බව වදාළහ. ආසවට්ඨානිය ධර්ම පහළ වීමට හේතුසාධක හතරක් බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇත.

1. චිරරාත්‍රඥ වීම (රත්තඤ්ඤු මහත්තතා)
2. පිරිස වැඩි වීම (වෙපුල්ල මහත්තතා)
3. ලාභාග්‍ර වීම (ලාභග්ග මහත්තතා)
4. බහුශ්‍රැත බව (බාහුසච්ච මහත්තතා)

මේ කරුණු හතරට අමතරව කීර්තියෙහි අගතැන් බවට පැමිණීමද ඈසවට්ඨානිය ධර්ම ප්‍රාතුර්භාවයට හේතුවක් ලෙස භද්දලි සූත්‍රයේ දක්වා ඇත. ශික්ෂා පද පනවනු ලබන්නේ ආසවට්ඨානිය ධර්ම දුරු කිරීම පිණිසය. කලන්දක පුත්‍ර සුදින්න ශික්ෂා ව්‍යතික්‍රමණය හේතුකොටගෙන බුදුරජාණන් වහන්සේ ප්‍රථම පාරාජිකා ශික්ෂා පදය පනවා වදාළහ. කරුණු දහයක් සැලකිල්ලට ගෙනයි බුදුරජාණන් වහන්සේ ශික්ෂා පද පනවා ඇත්තේ. එනම්,

1. සංඝයාගේ හිතසුව පිණිස
2. සංඝයාගේ පහසුව පිණිස
3. දුශ්ශීල භික්ෂූන්ට නිග්‍රහ පිණිස
4. ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිස
5. මෙලොවදී පැමිණිය හැකි දුක් දුරු කිරීම පිණිස
6. පරලොවදී පැමිණෙන දුක් නැසීම පිණිස
7. නොපහන් වූවන්ගේ පැහැදීම පිණිස
8. පහන් වූවන්ගේ ප්‍රසාදය වර්ධනය කිරීම පිණිස
9. සද්ධර්මයේ චිරස්ථිතිය පිණිස
10. විනයානුග්‍රහය පිණිස.

යන කරුණු දහයයි. භාග්‍යවතුන් වහන්සේ විසින් යථෝක්ත අරමුණු පෙරදැරි කොට ගෙන ආසවට්ඨානීය ධර්ම පහළ වීමට බලපාන හේතු මූලික කොට ගෙන විනය ශික්ෂා පද පනවා වදාළහ. උදවන තත්ත්වය අනුව ඇතැම් ශික්ෂා පදවලට සංශෝධනද ඉදිරිපත් කළහ. ඒවා අනුප්‍රඥප්ති වශයෙන් සැලකේ. ආර්ය ශ්‍රාවකයෝ අනුමාත්‍ර වූද වරදෙහි බිය දකිමින් ශික්ෂා සමාදන්ව හික්මෙන්නෝ වෙති. පරිනිර්වාණ සමයෙහි බුදුරජාණන් වහන්සේගෙන් ආනන්ද තෙරණුවන් විසින් ඔබ වහන්සේගෙන් පසුව අපගේ ශාස්තෘන් ලෙස සැලකිය යුත්තේ කවරෙක්දැයි විමසා සිටි විට තමන් වහන්සේ විසින් ධර්මය දේශනා කොට ඇති බවත් විනය පනවා ඇති බවත් තමන් වහන්සේගේ ඇවෑමෙන් ධර්මයත්, විනයත් දෙකම ශාස්තෘ වන බවත් වදාළහ. එයින් පැහැදිලි වන වැදගත් කරුණක් වනුයේ ධර්මය දැන විනයානුකූලව හැසිරීමෙන් ශාස්තෘන් වහන්සේගේ මාර්ගෝපදේශකත්වය අදත් අපට ලද හැකි බවය. ශාසනික පිළිවෙත සරුකර ගත හැකි බවය. ශාස්තෘත්වයෙහි අඩුවක් නොමැති බවය.

**පූජ්‍ය ආලංකුලමේ පේමසිරි හිමි**

''සුචරිතයෙහි හැසිරිය යුතුය. දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය. ධර්මයෙහි හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ.''

# නාම රූපවලින් තොර විඤ්ඤාණයක් තිබේද?

එක් කලෙක සැරියුත් තෙරුන් වහන්සේත්, කොට්ඨීත තෙරුන් වහන්සේත් බරණැස් නුවර ඉසිපතනාරාමයේ වාසය කරති. දිනක් හවස් යාමයේ භාවනාවෙන් මිදුණු කොට්ඨීත තෙරණුවෝ සැරියුත් හිමියන් වෙත පැමිණ මෙසේ කීහ.

"හිමියනි, මේ ලෝකය හා එහි ස්වභාවය පිළිබඳ හිතන විට බොහෝ ප්‍රශ්න මනසට නැගෙයි. හිමියනි, මිනිසා තුළ හට ගන්නා ජරාමරණ තමා විසින්ම කරන ලදද? අනුන් විසින් කරන ලදද? තමා විසිනුත්, අනුන් විසිනුත් කරන ලදද? තමා විසිනුත්, අනුන් විසිනුත් නොව ඉබේම හටගන්නා ලද දෙයක්ද?'' එවිට සැරියුත් තෙරණුවෝ මෙසේ කීහ.

හිමියනි, ජරාමරණ තමා විසින් කරන ලද්දේත් නොවෙයි. අනුන් විසින් කරන ලද්දේත් නොවෙයි. තමා විසින් හා අනුන් විසින් කරන ලද්දේත් නොවෙයි. ඉබේම හටගත් දෙයකුත් නොවෙයි.

කොට්ඨීත හිමි: සැරියුත් හිමියනි, ජාතිය (උපත) හට ගන්නේ කෙසේද?

සැරියුත් හිමි: භවය නිසා ජාතිය හට ගනී.

කොට්ඨීත හිමි: භවය ඉබේ හටගනු ලබන්නක්ද?

සැරියුත් හිමි: උපාදනය හේතුවෙන් භවය හටගනී.

කොට්ඨීත හිමි: උපාදන නාමරූප හටගන්නේ කෙසේද?

සැරියුත් හිමි: විඤ්ඤාණය හේතුවෙන් නාමරූප හටගනී.

කොට්ඨීත හිමි: විඤ්ඤාණය හටගන්නේ කෙසේද?

සැරියුත් හිමි: නාම රූප නිසා විඤ්ඤාණය හටගනී.

කොට්ඨීත හිමි: නාම රූප හේතුවීමෙන් විඤ්ඤාණය හට ගන්නා බව තරමක් පැහැදිලියි. නමුත් මෙහි අර්ථය ගන්නේ කොහොමද?

සැරියුත් හිමි: එය පැහැදිලි වෙන්න උපමාවක් කියන්නම්. මෙය අන්‍යෝන්‍ය වශයෙන් එකට හේත්තු කර තිබෙන දර මිටි දෙකක් වගෙයි. එකක් නිසා අනික පවතියි. එපරිදියි. නාම රූප නිසා විඤ්ඤාණය පවතියි. විඤ්ඤාණය නිසා නාම රූප පවතියි. නාම රූප නිසා සළායතනය වෙයි. මේ ආකාරයෙන් පංචස්කන්ධයේ හටගැනීම වෙයි. අන්‍යෝන්‍ය වශයෙන් එකට හේත්තු කර තිබෙන දරමිටි දෙකින් එකක් ඉවත් කළහොත් අනික වැටෙයි. එපරිදිම නාමරූප නිරෝධයෙන් විඤ්ඤාණය නිරෝධ වෙයි. විඤ්ඤාණය නිරෝධයෙන් නාමරූප නිරෝධ වෙයි. නාමරූප නිරෝධයෙන් ස්පර්ශය නිරෝධ වෙයි.

කොට්ඨීත හිමි: හිමියනි, ආශ්චර්යයි, අද්භූතයි. ඔබවහන්සේගේ පැහැදිලි කිරීම ඉතාම අගනේය.

සැරියුත් හිමි: හිමියනි, යම් භික්ෂුවක් ජරාමරණයෙහි කලකිරීම විරාගය නිරෝධය පිණිස බණ කියනවා නම් ධර්ම කථික භික්ෂු නමකැයි කීමට සුදුසුයි.

සං.නි. නලකලාප සූත්‍රය ඇසුරිනි.

බුදුහිමියන් සත්ත්වයා හට පැහැදිලි කළ ධර්ම කරුණුම ඇතැම් විට ධර්ම කථික ශ්‍රාවක ශ්‍රාවිකාවන් විසින්ද පැහැදිලි කරනු ලැබූ අවස්ථා සූත්‍ර පිටකයේ හමුවෙයි. සංයුක්ත නිකායේ දක්නට ලැබෙන ඉතා වැදගත් සූත්‍රයක්




''ඇත්ත කිව යුතුය. අනුන්ට නොකිපිය යුතුය. අනිකකු යමක් ඉල්ලූ කල ටිකක් වුවත් දිය යුතුය. මේ තුන් කරුණෙන් කෙනෙකුට දෙවියන් වෙත යා හැකිය.''

වන නලකලාප සූත්‍රය තුළ අඩංගු ධර්ම කරුණු පැහැදිලි කරනු ලබන්නේ සැරියුත් මහ තෙරුන් වහන්සේ විසිනි. උන්වහන්සේ ඒවා පැහැදිලි කරනු ලබන්නේ කොට්ඨිත හිමියන් හටය. මෙබඳු ලෙස ශ්‍රාවකයන් විසින් දේශිත සූත්‍ර ධර්ම හඳුන්වනු ලබන්නේ ශ්‍රාවක භාෂිත ලෙසයි. මෙබඳු සූත්‍ර කිහිපයක්ම සූත්‍ර පිටකය තුළ දක්නට ලැබේ. එම සූත්‍රද සූත්‍ර පිටකයේම ඒවා වශයෙන් සැලකේ. ඉන් පරිබාහිරව ඒවා ලෙස නොසැලකේ. එයට හේතුව එම සූත්‍ර ධර්මවල අන්තර්ගත කරුණුද බුදුහිමින්යන්ගේ දේශනාවලට සමාන වූ ඒවා නිසාය. බුදුරජාණන් වහන්සේ අනුමත කළ ඒවා නිසාය.

මෙම සූත්‍රයේ එන ධර්ම කරුණු සාමාන්‍ය මිනිසාට එතරම් ඉක්මනින් වටහා ගැනීමට පහසු නැත. බොහෝ විට එම කරුණු යථාර්ථවාදී ලෙස හෙවත් දර්ශනික ලෙස විවරණය කොට තිබීම එයට හේතුවයි. සාමාන්‍ය සම්මුති ලෝකයේ සියල්ල සත්‍යය ලෙස තබාගෙන කරන කියන ධර්ම දේශනා ලෙස නොව සම්මුති ලෝකය හටගන්නා ආකාරය පිළිබඳව කරන පැහැදිලි කිරීමක් ලෙස මෙහි ඇතුළත් ධර්ම කරුණු ඉතාමත් වැදගත් වෙයි. නාමරූප ධර්ම හා විඤ්ඤාණය පිළිබඳව කරනු ලබන පැහැදිලි කිරීමද ගැඹුරු ධර්ම කරුණකි. එයද වටහා ගත යුත්තේ ඉතා සියුම්ව ධර්මය පරීක්ෂා කර බැලීමෙනි. එසේ නොවුණහොත් ඒ පිළිබඳව වැරදි වැටහීම් ඇතිවිය හැකිය. නාමරූප විඤ්ඤාණයෙන් පරිබාහිරවත් විඤ්ඤාණයද ඒ ආකාරයෙනුත් පවතින බව මෙහි පැහැදිලි කරනු ලබන්නේ සරල උපමාවකිනි. දරමිටි දෙකක් තිබේ. ඒ දෙකම පවතින්නේ ඒ දෙකටම හේත්තු කිරීම නිසාය. එකක් නිසා අනික පවතී යැයි කිව්වහොත් සත්‍යය එයයි. ඒ පවතින ක්‍රමය දෙස නිවැරදිව බැලූවකු හට වැටහෙන්නේ එම ක්‍රමයට ඒ දෙක පවතින්නට නම් ඒ විදිහටම පැවැතිය යුතු බවයි. ඉන් එකක් ඉවත් කළහොත් අනිකෙහි පැවතීමද එතැනින් නිමාවෙයි. නාමරූපයෙහිත්, විඤ්ඤාණයෙහිත් පවතින සබඳතාව එබඳුය. ඉන් එකකට තනිව පැවැතිය නොහැකිය. ධර්ම ඥානය වර්ධනය කරගනු රිසි කෙනකුට මේ කරුණු තවදුරටත් අධ්‍යයනය කර බැලිය හැකිය. ඒ සූත්‍රය අදළ අටුවාවද පරීක්ෂා කර බැලීමෙනි.

පුද්ගලයා ලෙස හඳුන්වනු ලබන්නා වූ නාමරූප, ධර්මද, විඤ්ඤාණය හෙවත් සිතද ශරීරය තුළ පවතින විට සිත එකක්ද, ශරීරය අනිකක්ද යනාදී ගැටලු කෙනකුට ඇතිවන්නට පිළිවන. ශරීරය නැතිව සිතෙහිද, සිත නැති ශරීරයෙහිද පැවැත්ම කෙසේ පවතින්නේද යන වග මෙහි මැනවින් පැහැදිලි කරනු ලැබ ඇත්තේ පෙර කී ගැටලු හටගැනීම වැළැක්වීම සඳහා විය හැකිය.

**මහාචාර්ය පාතේගම ඥාණිස්සර හිමි**



"යකඩයෙන් නැගුණ මලකඩ එම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි."

# දළදා වරුණ


මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාලිගය
මහනුවර



දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridalada maligawa.lk


## මළමිනී සේ දිවි ගෙවන පවුල් සංස්කෘතිය නතර කරමු

වසරක් ගෙවී නව වසරක් උදාවීමට ඇත්තේ තවත් ටික දිනකි. ගෙවුණු වසර දෙස ආපසු හැරී බලන්නැයි කීවොත් ඔබට සතුටු විය හැකිද? ඇතැමකු මේ ප්‍රශ්නයට "ඔව්" යැයි කියන්නට පුළුවන. තවත් කෙනකු "නැත" යැයි කියන්නට පුළුවන.

තථාගත අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ උතුම් ශ්‍රී සද්ධර්මය දේශනා කොට වදාළේ අපගේ මෙලොව පරලොව ජීවිතය සාර්ථක කරගැනීම සඳහාය. එහිදී ලෞකික ජීවිතය සාර්ථක කරගැනීම අතිශය වැදගත් වූවකි. මන්ද යත්, ලෞකික ජීවිතය සාර්ථක කර නොගෙන පරලොව ජීවිතය සාර්ථක කරගැනීමට සිතීමත් විහිළුවක් වන බැවිනි.


තත්පරයෙන් තත්පරය, පැයෙන් පැය, දවසින් දවස කාලය ගෙවී යයි. එය අපට නතර කළ නොහැක. ගෙවුණු වසරත්, එළඹෙන නව වසරත් එසේමය. වර්තමානයේ බොහෝ දෙනකුගේ ලෞකික ජීවිතය බිඳවැටී තිබේ. ඇතැමුන් පවුල් කන්නේ රටට, ලෝකයට පේන්නටය. ගෘහස්ථ ජීවිතය පිළිබඳව ඉතා හොඳින් විග්‍රහ කළ අප භාග්‍යවතුන් වහන්සේ අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ ප්‍රථම සංවාස සූත්‍රයේ දේශනා කළ පරිදි ස්වාමියා සහ භාර්යාව අතර ගත කරන ජීවිතය කොටස් හතරකට බෙදා තිබේ.


පළවන එක්ව විසීම නම් මළමිනියක් මළමිනියක් සමග ජීවත් වීමයි. (ඡවෝ ඡවාය සද්ධිං සංවසති). දෙවන එක්ව විසීම නම් මළමිනියක් දෙව් දුවක් සමග වාසය කිරීමයි. (ඡවෝ දේවියා, සද්ධිං සංවසති), තුන්වන එක්ව විසීම නම් දෙවියෙක් මළමිනියක් සමග එක්ව විසීමයි. (දේවෝ ඡවාය සද්ධිං සංවසති), හතරවන එක්ව විසීම නම් දෙවියෙක් දෙව්දුවක් සමග විසීමයි. (දේවෝ දේවියා සද්ධිං සංවසති.)

අද සමාජයේ බහුලව ජීවත් වනුයේ මෙහි පළමුව දැක්වූ පරිදි මළමිනියක් සේ දිවි ගෙවන අඹු සැමියන්ය.

මෙවැනි පවුල්වල ස්වාමියා සහ භාර්යාව දුශ්සීලවම කාලය ගෙවයි. ඉරිසියාව, ක්‍රෝධය, වෛරය, පළිගැනීම, එකටෙක කිරීම ආදී දුර්ගුණයන්ගෙන් ජීවිතය පිරී පවතී. ලෝභකම දෙදෙනා තුළම රජ කරයි. කිසිදු අවස්ථාවක දනයකට පාපකාරී සිත නොනැමෙයි.

නිතරම මහා සංඝරත්නයට බැණ වදියි. උන්වහන්සේලාගේ අඩුපාඩුම සොයමින් නින්දා කරයි. විහාරස්ථානවලට සම්බන්ධ පිනට දහමට ලැදි ඇත්තන්වද බොහෝ විට අපහාස කරයි. නින්දා කරයි. මේ දෙපළම ධර්ම දේශනා ඇසීමට කිසිදු ප්‍රියතාවක් දක්වන්නේ නැත. එබැවින් කර්මය, කර්ම ඵලය පිළිබඳව වැටහීමක් එවැන්නන්ට නැත. විශ්වාසයක් නැත. පාපකාරී ලෙසම ජීවිතය ගත කිරීමට පුරුදුව සිටී. යම් හෙයකින් මෙම ජීවන රටාව වෙනස් නොවුණහොත් ඔවුන් මරණින් මතු නිරයගාමී වීම නියතය. එබැවින් මේ කරුණු තේරුම් ගෙන ඔබ තුළ මෙවැනි අඩුපාඩුකම් තිබේ නම් ඉක්මනින්ම නිවැරදි කරගත යුතු ය. ඔබ දන්නා අය තුළ මේ අඩුපාඩු තිබේ නම් ඉක්මනින්ම ඒ අය එයින් ගලවා සුමගට යොමු කර ගත යුතුය. එසේ වුවහොත් ඔබ ඔවුනට කල්‍යාණ මිත්‍රයකු වනු ඇත. එය මුළු සමාජයටම කරන යහපතකි. ■





අපේ පූද බිම්



# නාගදීපයේ යටගියාව සොයා යමු...!

බුදුරජාණන් වහන්සේ දෙවන වර ලංකාගමනය සඳහා වැඩම කළේ නාගදීපයටය. එද නාගදීපයේ වාසය කළේ "නාග" නමින් ව්‍යවහාර කළ ජන කොටසකි. එහි චූලෝදර හා මහෝදර නා රජවරු අතර මිණි පළඟක් වෙනුවෙන් ඇතිවීමට ගිය ආරාවුලක් මැඩපැවැත්වීමට බුදුරජාණන් වහන්සේ සෘද්ධියෙන් වැඩම කළ බවත් එද සමිද්ධි සුමන නම් දෙවියන් දෙව්රම් වෙහෙර දෙරටුවේ තම වාසභවනය වූ කිරිපලු රුක උදුරාගෙන එය බුදුන් වහන්සේට ඡත්‍රයක් මෙන් ඉහළා මෙහි පැමිණ තිබේ.

එද බුදුරජාණන් වහන්සේ නාග රජවරු දෙපිල බෙදී ඇතිවීමට ගිය සටන සමගි කොට සන්සිඳ වූහ. ඔවුන්ට කාකොලූක, ලටුකික, වට්ටක ආදී ජාතක කතා දේශනා කරමින් සමගිව විසීමේ අනුසස්ද උන්වහන්සේ පෙන්වූහ. ධර්ම දේශනාව අවසානයේ නාග ජනයා මිණි පළඟ බුදුහිමියන්ට පූජා කළෝය. උන්වහන්සේ මිණි පළඟත්, කිරිපලු රුකත් දෙකම නාගයන්ටම පවරා ආපසු වැඩම කළහ.

එද බුද්ධස්පර්ශයෙන් පවිත්‍ර වූ නාගදීපයේ කිරිපලු රුක රෝපණ කෙරුණු අතර එම බිම විහාරයක් දක්වා ගොඩනැගිණ. ආරවුල ඇතිවූ මිණි පළඟ මණිඅක්ඛිත නා රජු විසින් කැලණියට රැගෙන ගිය බවද සඳහන් වේ.

ඒ අනුව වංශකතා මූලාශ්‍රවල නාගදීප යන නාමය අපැහැදිලි නැත. ඉතාම පැහැදිලිව නාගදීප නම භාවිත වී ඇත. බුදුරජාණන් වහන්සේ "නාගදීපයට" වැඩම කළා යන පුවත මහාවංශය, දීපවංශය ඇතුළුව පස්වන සියවසට අයත් සමන්ත පාසාදිකාව, මහාවංශ ටීකාව (5 වන සියවස), නිකාය සංග්‍රහය (13 සියවස), පූජාවලිය (13 වන සියවස) ආදී මූලාශ්‍ර පොත්වල සඳහන් වේ.

අනුරාධපුර යුගයේ ලියැවුණු සහස්ස වත්ථුප්පකරණයේ මෙසේ සඳහන් වේ.

"සට්ඨි මත්ත භික්ඛූ නාගදීපෙ
රාජායතන චේතියං"

ඒ අනුව නාගදීපය භික්ෂූන් වහන්සේ වැඩ සිටි පුරාණ විහාරයක් බව පෙනේ.

පොළොන්නරු යුගයෙන් පසු 12 වැනි සියවසේදී ලියැවෙන රසවාහිණියේ "භගවතී ධරමානේ ලංකායං නාගදීපේ" වශයෙන් සටහන් හමුවේ.

ඉතා පැරණි මූලාශ්‍ර ග්‍රන්ථවල "නාගදීප වචනය" වෙනසකින් තොරව භාවිත වූ නිසා පැහැදිලි විය යුතු එක් කරුණක් තිබේ. එනම් 12-13 සියවස් දක්වා නාගදීප වචනය අද භාවිත කරන ප්‍රදේශයේ පැවැති පැරණි නමයි. මේ "නාගදීප" භාවිතය අද නයිනතිව් වශයෙන්ද හඳුන්වන දූපතට පමණක් පොදු වූවක් වුණත් අතීතයේ මුළු යාපන අර්ධද්වීපයටම භාවිත කර ඇත්තේ "නාගදීප" යන නාමයයි. එහි කිසිම සැකක් - සංකාවක් හෝ අවිශ්වාසදායක කාරණාවක් නැත. දෙමළ විද්වතකු වන මහාචාර්ය පද්මනාදන් පවා මෙය පිළිගන්නවා පමණක් නොව යාපනය දෙමළ රාජධානියක් වීම 13 වන සියවසින් පසුව සිදුවූ බවද ඔහු පවසයි.

වංශකතාවෙන් ඔබ්බට පුරාණ අභිලේඛණ සොයා ගිය විට ඒවායේ නාගදීපය හඳුන්වා ඇත්තේ "නකදිව" යන නමිනි. නකදිව නාගදීපය බවද අපැහැදිලි නැත.

පැරණි අභිලේඛනයක් වන ක්‍රි.ව. 65-111 වසභ රජු සමයට අයත් වල්ලිපුරම් රන්පත මීට හොඳ උදහරණයකි. එහි මෙසේ දක්වේ.

"සිද මහ රජ වහයහ රජයෙහි අමතෙ
ඉසිගරියෙ නකදිව බුජමෙනි
බදකර අතනෙහි පියගුක තිස
විහර කරිතෙ"

මෙහි සිංහල අර්ථය කෙටියෙන් ගත් විට වසභ මහ රජු ලංකාව පාලනය කරන සමයේ ඉසිගිරිය නමින් ඇමැතියකු (නකදිව) නාගදීපය පාලනය කර ඇත. එද පියගුක තිස නමැත්තකු "බදකර අතනෙ" නම් ස්ථානයේ විහාරයක් කරවා ඇත.

මෙම වල්ලිපුරම් රන්පත හමුවූයේ වඩමාරච්චි ප්‍රදේශයට නුදුරු වල්ලිපුරම් ගමෙනි. ක්‍රි.ව. දෙවන සියවසේදී "බදකර අතනෙ" යනු වල්ලිපුරම් ලෙස ඉතිහාසඥයෝ විශ්වාස කරති.

ක්‍රිස්තු වර්ෂ 4-5 සියවස්වලට අයත් මණිමේඛලෙ නම් දෙමළ කාව්‍යයට අනුව මුදලි ශ්‍රී රාසනායගම් මහතා පවසන්නේ එද නාගදීපය යනු අද සමස්ත යාපන අර්ධද්වීපයම බවය. මහා දයීක මහා නාග රජු කරවූ පාෂාණ දීඝක විහාරය නාගදීපය බවද විශ්වාසයකි. ඇතැම් විට එතුමා මෙම විහාරය ප්‍රතිසංස්කරණය කරවන්නට ඇත.

තොලම්ගේ සිතියම් පරීක්ෂාවේදී "නාගදීප්" ලෙස දක්වන්නේ යාපන ප්‍රදේශයයි. 12 වැනි සියවසට අයත් අත්පිටපාලිනි මූලාශ්‍ර ග්‍රන්ථයට අනුව භික්ෂූන් වහන්සේලා දීප විහාරය වන්දනාවේ ගිය බව කියැවේ. එම දීප විහාරය යනු නාගදීප විහාරයයි. අනුරාධපුර යුගයේ මුල් සමයට අයත් සම්මෝහ විනෝදනියේ "දීප රාජ" ලෙස දක්වන්නේත් යාපනයේ පාලකයාය.

දනට නයිනතිව් දූපත හෙවත් නාගදීපය අසල නාක පූසනි අම්මාන් නමින් කෝවිලක් තිබේ. මෙහි දෙකට කැඩුණු සෙල් ලිපියක් පවතින අතර එය ක්‍රි.ව. 1153-1186 කාලයේ පොළොන්නරුවේ පාලනය කළ මහා පරාක්‍රමබාහු රජ සමයට අයත් වෙන්නකි. දේවාල දෙරටුව ළඟ ඉතිරිව ඇති කොටස අනුව කයිට්ස් වරායේ නැවක් ගිලුණොත් හෝ කැඩුණොත් හෝ එයින් භාණ්ඩාගාරයට ලැබිය යුතු කොටසක් ගැන කියැවේ. සෙල් ලිපියේ ඌරත්තොට යනු වත්මන් කයිට්ස් වරායයි. එය එද ප්‍රධාන වෙළෙඳ නාවුක වරායක් වූ බවද පෙනේ.

එද මුළු යාපන අර්ධද්වීපයටම අභිලේඛනවලදී නකදිව ලෙසද, මූලාශ්‍ර ග්‍රන්ථවලදී නාගදීපය ලෙසද හැඳින්වූ බව පෙනේ. මෙය යාපනය බවට පත් වූයේ ක්‍රි.ව. 13 සියවසේ (දඹදෙණි යුගය) ජාවක චන්ද්‍රභානු ආක්‍රමණිකයාගේ පැමිණීමෙන් පසුය. ඔහුගේ පැමිණීමෙන් පසු ජා පට්ටන ඇතිව පසුව එය යාපා පට්ටන වී නැවත යා පට්ටනය, දන් යාපනය වී ඇත. නමුත් නිවැරදි ජා පට්ටන හෙවත් යාපනය යනු ඌරත්තුරෙයි හෙවත් කයිට්ස් ප්‍රදේශය විය යුතුය.

වර්තමානයේ නයිනතිව් ලෙස හඳුන්වන නාගදීප කොටසට නයිනතිව් ලෙස භාවිත නාමය ඇත්තේ ඉතා මෑත යුගයක. "නයිනතිව්" යන්න කිසිදු ඉතිහාස හෝ පුරාවිද්‍යාත්මක පදනමක් දනට යාපන අර්ධද්වීපයේ හෝ රටේ කිසිම තැනකින් හමුවන අභිලේඛනයක, මූලාශ්‍ර ග්‍රන්ථයක නැත. එය පසුකාලීනව දෙමළ ජනතාව විසින් ගොඩනගා ගන්නා ලද්දකි.

එහෙත් පැරණි නාගදීපය "නකදිව" යන්න සිංහල පමණක් නොව දෙමළ මූලාශ්‍රවල පවා සියවස් ගණනක් මුළුල්ලේ පවතින්නකි. අප උත්සාහ කළ යුත්තේ නාගදීපය භාවිතයෙන් ඉවත් කරන්නට නොව එය යාපනයේ සුළු කොටසකට පමණක් එය භාවිත කරන්නේ ඇයි? යන්නය. ක්‍රි.ව. 1-2 සියවස්වල සිට හමුවන සියලු මූලාශ්‍රවල නකදිව - නාගදීප නම මුළු යාපන අර්ධද්වීපයටම භාවිත කළා නම්, එය බෞද්ධ බලකොටුවක් වී නම් අද "නාගදීප" භාවිතය කුඩා දූපතකට කොටුවීමද ගැටලුවකි. පමණටත් වඩා ඉතිහාස, පුරාවිද්‍යා හා ඓතිහාසික සාධක තියෙද්දී, අලුත හදාගත් නයිනතිව් පස්සේ නොගොස් "නාගදීපයට" සිදුවූ දේ සොයා ගත යුතුය.


පේරාදෙණි විශ්වවිද්‍යාලයේ ඉතිහාස අංශයේ කථිකාචාර්ය, ආචාර්ය රෝහිත දසනායක


"අසව්ලා මට බැන්නේය. මට ගැසුවේය. මා පැරදවූයේය. මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් කෙනෙකු ක්‍රෝධය සිතෙහි දැඩි කොට බැඳ ගනිත්ද ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ." - (ධම්ම පදයේ 3 වන ගාථාව)



# ස්ත්‍රී පුරුෂ ආත්මභාව ලැබෙන්නේ කොහොමද?

# ආදරය සසර පුරා එකට බැඳී ගමන් කරනවාද?

## අග්ගමහා පණ්ඩිත බෙල්ලන ඥානවිමල මහනාහිමියන් වදාළ දුන් පිළිතුරු

ආදරය නොහඳුනන සත්වයකු සකල සක්වලේම නොමැති තරම්ය. එහෙත් ඒ ආදරය තුළ ඇති ගැඹුරු බව මතුපිටින් බලන හැමට නොපෙනෙයි. සක්වළ පුරා පැතිර ඇති අමරණීය ප්‍රේමය ''සක්වළ සක්මනට'' ද දිස් වේ. මෙතැන් සිට සසර කතරෙහි අතරමන්ව ඔත්පල වූ සිත්වලට ප්‍රේමයේ ඔසු සොයා විශ්වයේ සැරි සරමු.

**❒ මහානායක හාමුදුරුවනේ, විඥානය සමග එකට බැඳි ආදරයක් සංසාරයේ අඛණ්ඩව පෙරට ගමන් කරනවාද?**

ඔව්. ආදරයත් පංචස්කන්ධයට මිශ්‍රව සසර දිගටම ගමන් කරනවා. පංචස්කන්ධයන්ගේ පැවැත්ම නතර වනතුරු ගමන් කොට එතැනින් ආදරයත් නතර වෙනවා.

''ථෙරී ආපදානයෙහි'' විස්තර වන පරිදි, සිද්ධාර්ථ - යශෝධරා දෙපළගේ ආදරයත් මේ විදියට සිද්ධ වෙලා තිබෙනවා. එනම්, යශෝධරාවන් සසරේ අපමණ ජීවිත ගණනක බෝසතුන් සමග සෙවණැල්ල වගේ ගමන් කරමින් ආදරණීය භාර්යාව වුණා.

මුව ජාතියේ, ලේන කුලේ හා කිඳුරු යෝනියේ ආදී විවිධ තිරිසන් ආත්ම භාවවලදී පවා මේ දෙදෙනාගේ ආදරය නතර වුණේ නැහැ. සිය අවසන් ආත්ම භවයේදී යශෝධරා මෙහෙණින් වහන්සේ රහත් වී පිරිනිවන් පෑමට යද්දී බුදුරදුන් හමුවී සදහටම සමුගත්තා. එහිදී එතුමිය විසින් තමන් සසර සැරි සැරූ කාලයේ විවිධ තොරතුරු සඳහන් කරනු ලැබුවා. ඉනික්බිතිව, බුදුරදුන්ද ඒ බව අනුමත කර සිටියා.

**සිද්ධාර්ථ - යශෝධරා ප්‍රේමය**

**❒ ඒ වුණාට, බුදුරදුන් එවැනි විස්තරයක් දේශනා කළ වෙනත් අවස්ථාවක් පිළිබඳව බුදු දහමේ දක්වෙන්නේ නැහැ නේද?**

"නීතිගරුකව කටයුතු කිරීම හැම අතින්ම හිතකරය - ගග්ග ජාතකය"

ඒකට හොඳම උදහරණය බුදුරදුන් කිඹුල්වත්පුර ගමනේදී යශෝධරාවන්ට ''චන්න කින්නර ජාතකය'' දේශනා කිරීමයි. පන්සිය පනස් ජාතක කතා පොතේ 473 වෙනි ''සඳ කිඳුරු ජාතකය'' හෙවත් ''චන්න කින්නර ජාතකයෙහි'' බුදුරදුන් කළ විවරණය මෙසේ දක්වෙනවා.

''මහරජ, යශෝධරාව මාගේ අභිනිෂ්ක්‍රමණයෙන් පසු සියලු සැප අතැර එක් වේලක් පමණක් ආහාර ගනිමින්, බිම සයනය කිරීම සහ අන් පුරුෂ පණිස නොපැතීම ආශ්චර්යයක් නොවෙයි.

ඇය මා සමග මෙලෙස සසර සරද්දී තිරිසන් යෝනියෙහි උපන් අවස්ථාවල පවා ඇගේ ආදරය නිකැලැල්ව පැවතුණා.''

ඒ කෙසේදැයි ශුද්ධෝදන පිය රජතුමන් විසින් ආරාධනා (විමසීම්) කරනු ලැබුවෙන් මේ ජාතක කතාව දේශනා කොට වදළා.

එම ආත්මයේදී බරණැස් රජු දූන් අනුරුද්ධ මහ රහතන් වහන්සේයි, කින්නරාංගනාව මේ යශෝධරා නම් තොපගේ ලේලියයි. සඳ කිඳුරා නම් බුදු වූ මමම වේ දැයි පූර්වාකාර සන්ධි (අතීත - වර්තමාන ආත්ම) ගලපනු ලැබුවා.

❒ එතකොට, බුදුවීමට පෙර අවසන් වතාවට උපත ලැබූ වෙස්සන්තර ආත්ම භාවයේ සිටි දරු දෙදෙනා ගැන විස්තර වෙන්නේ නැද්ද?

සිද්ධාර්ථ - යශෝධරා පෙර භවයේ, වෙස්සන්තර - මන්ත්‍රී දේවිය බව කවුරුත් දන්නවනේ. ඒ වගේම, ඒ දෙන්නාට සිටි දරු දෙන්නා ජාලිය - ක්‍රිෂ්ණජිනා කියලත් අමුතුවෙන් කිව යුතු නැහැ. මේ දරක ස්නේහයත් සංසාරයේ බොහෝ ආත්මවල එකට ගමන් කර තිබෙනවා. ඒ නිසයි, සිය අවසන් ආත්ම භවයේදී පවා ජාලිය කුමරු මේ දෙදෙනාගේම පුතු රාහුල කුමාරයා වී උපත ලැබුවේ. නමුත්, ක්‍රිෂ්ණජිනාට සිද්ධාර්ථ-යශෝධරා දෙපළ දෙමාපියන්ට නොවුණාට ඇයත් මේ අයගේ ඇසුර ලබන මානයේ උපත ලැබීමට භාග්‍යවන්ත වුණා. ඒ රූමත් උත්පලවණ්ණා තෙරණිය හැටියටය.

### ස්ත්‍රී, පුරුෂ ආත්ම භාව ලැබීම

❒ හොඳයි, එතකොට 'පිරිමි' ආත්ම ලැබූවන් පිරිමින් විදියට සහ 'ස්ත්‍රී' ආත්ම ලැබූවන් ස්ත්‍රීන් විදියටමද? සසරේ බොහෝ විට උපදින්නේ?


නැහැ, නැහැ. තම තමන්ගේ කර්ම ශක්තීන් අනුවයි ඒක සිදු වෙන්නේ. දූන් සිද්ධාර්ථ කුමාරයාගේ මව වූ මහාමායා දේවිය පවා සත් දිනකින් කළුරිය කොට, තුසිත දෙව් ලොව උපත ලැබුවේ 'මාතෘ දිව්‍ය පුත්‍රයා' ලෙසයි.

ඒ වගේම අපේ සිද්ධාර්ථ ගෞතම බෝසතාණන් වහන්සේ පවා 'ස්ත්‍රී' ආත්ම භාවයක ඉතා පූර්වයෙන් උපත ලබා සිටි බව බුදු දහමේ විස්තර වෙනවා. ඒ, අපේ ගෞතම බෝසතුන්ට පළමු වරට නියත විවරණ දුන්

22 පිටුවට ▶



"තමාගේ තරමට වඩා උඩඟුව කටයුතු කිරීමෙන් පිරිහේ - විනීල ජාතකය"



දීපංකර බුදුරදුන්ටත් කලින් ලොව වැඩ සිටිය පුරාණ දීපංකර බුදුන් දවසේදීයි.

### ඈත භවයේ රාජ කුමරිය

❒ එහෙම නම්, එපමණ ඈත අතීතයට අයත් වන අප මහ බෝසතුන් හා බැඳුණු එම විවරණය කෙබඳුද?

ඔව්. අපේ අටවිසි බුදුවරුන්ටත් පෙර සොළසා සංඛ්‍ය කල්ප ලක්ෂයක් කල් පාරමී දම් සපිරූ බුදුරජාණන් වහන්සේ නමක් පූර්ව දීපංකර නමින් ලොව පහළ වී සිටියා. එදවස අප මහ බෝසතුන්ට (සුමේධ තවුසාට) පළමු වරට නියත විවරණ දුන් දීපංකර බුදුරදුන්ද තාපසයකුව ඉපදී උන්නා. මේ දීපංකර තාපසයා පුරාණ දීපංකර බුදුන්ට තෙල් පහන් පුද මතු කලෙක තමන්ද එනමින්, එලෙසින්ම බුදු වන බවට අධිෂ්ඨාන කෙරුවා. ඒ අනුව හැමදාම මේ දීපංකර තවුසා පුරාණ දීපංකර බුදුන්ට තෙල් ගෙන ගොස් දීම සිදු කළා.

එක් දිනක් එක ගෙදරකින්වත් තෙල් බිඳක් සොයා ගන්න බැරි වුණා. එහිදී, දීපංකර තාපස තෙම රජ මාලිගාවට තෙල් සොයාගෙන ගියා. මේ රජ මැදුරේ සිටි කුමාරිකාවක විසින් ඇගේ සිය ඥාති සොයුරා වූ පුරාණ දීපංකර බුදුන් උදෙසා නොපැකිලව සිද්ධාර්ථ තෛලය ගෙනවිත් තාපසයා වෙත දෙනු ලැබුවා. එම අවස්ථාවේදී ඇය විසින් තමන් තුළද මතු බුදු බව ප්‍රාර්ථනා කිරීමට ඇති අති මහත් කැමැත්ත පිළිබඳව සිය සොයුරු පුරාණ දීපංකර බුදුන්ට දනුම් දෙන ලෙසත් පවසනු ලැබුවා.

ඒ අනුව, පුරාණ දීපංකර බුදුන් සිය නැගණියගේ අතීතාත්ම පිළිබඳ ස්මරණයක යෙදී ඇයට මෙම සිතුවිල්ල මීට ආත්මභව තුනක සිට ඇති වූවක් බව දැක, මතු සොළසා කල්ප ලක්ෂයක් ගිය තැන නිර්මාණය වන සාර මණ්ඩ කල්පයේදී බුදු වන ඔබගෙන්ම නියත විවරණ ලැබ ''සිද්ධාර්ථ ගෞතම'' නමින් බුදු බව ලබන බව දීපංකර බෝසත් තවුසාණන් සමග පැවසුවා. එලෙස රජ මැදුරේ කුමරියක වී සිද්ධාර්ථ තෛලය පූජා කළේ, අප සිද්ධාර්ථ ගෞතම බුදු පියාණන් වහන්සේයි.

### යශෝදරාවත කවි

මුව ජාතියේවද පළමුව උපන්නේ
එම ජාතියේ සිට නැරම මම එන්නේ
කොයි ජාතියේ උපනත් මෙහෙසුන් වන්නේ
මේ ජාතියේ ඇයි මා තනිකර යන්නේ

එද ගියේ තපසට දෙන්න සහ කැලේ
වඩා දෙදරුවන් උකුලට රැගෙන ලොලේ
බෙද උනිමි පන්සල් දෙකම එක කැලේ
මෙද මොකද තනිකර යන්ට මා කලේ

උන්නෙමි අපි ඉපිද ලෙහෙනුන් කුලේ එද
වැටුණේ ජලය මැද සමුදුර බිලිඳා
දිනුණේ කරපු වීරිය ගොඩ ගන්න එද
හිමි රජුනේ මග ඇරියේ මන්ද මෙද

කිඳුරු වෙලා අපි දෙන්නම උපන්නේ
ඇඳුරු සඳ පව්ව එකඟව වැඩ උන්නේ
සොඳුරු අපි දෙන්නා එක රැට වෙන්වුණේ
දෙදරු ඉතින් අද දක්වා අඬන්නේ

ඇතා වෙලා හිමයෙ ඔබ උපන් එද
සිතා ඇවිත් විද හෙළුවේ වැදි නොවෙද
පතා අහිරි ගා සිටියේ මම නොවෙද
පුතා දමා වැඩියේ ඇයි මහිමි සද

සත් දවසක් අඹ උයනේ වැඩ සිටලා
සත් වෙනිද රජගහ නුවරට වැඩලා
පෙරත් බුදුන් කළ දේ දිවසින් දැකලා
ගෙනත් අහර වැළඳුවෙ ගංතෙරදී බලා

**චාමික මුණසිංහ**

"උත්සාහවන්තයා සියල්ල ජයගනී - වණ්ණුපථ ජාතකය"

# පව් කළ ගැහැනියකගේ දුක්බර කතාව

## මන්තා ප්‍රේත වස්තුව



භූත යන පුතුගේ පියාට තිස්ස හා මත්තා කියා බිරිඳන් දෙදෙනෙක් වූහ. පසු කලෙක නරක ගති පැවතුම් තිබූ මත්තා මැරී ප්‍රේතියක් වී ඉපදී දිනක් භූතගේ පියා නිවසේ නැති අතරේ නිවස අසලට ආවාය. මේ ප්‍රේතිය දුටු තිස්සාව ප්‍රේතියගෙන් තොප කවරෙක්දැයි ප්‍රශ්න කළාය. එහිදී ප්‍රේතිය තමා මේ නිවසේ සිටි මත්තා බව කීවාය. කුමන පවක් කොට ප්‍රේත ලෝකයේ උපන්නේදැයි ඇසූ විට ප්‍රේතිය මෙසේ කීවාය.

1. චණ්ඩී ච ඵරුසා චාසිං ඉස්සුකී මච්ඡරී සඨා
නාහං දුරුත්තං වත්වාන ප්‍රේතලෝක මිතෝ ගතා
(ප්‍රේත වත්ථු පාලි 137 ගාථාව)

''මම ක්‍රෝධ කරන, පරුස බස් කියන, මසුරු සිත් ඇති, කෛරාටික ගති ඇත්තියක් වූමු. මම ඒ නපුරු වචන කතා කොට මෙලොවින් ප්‍රේත ලෝකයට ගියෙමු'' යැයි ප්‍රේතිය කී බව අර්ථ දත යුතුය.

2. ඉක්බිති තිස්සාව විසින් කවර පාපකර්මයක් හේතුවෙන් පසින් ගැවසුණු සිරුරක් ඇත්තියක් වූයේදැයි අසන ලදී. එහිදී තමා මනුලොවදී ලස්සන ඇඳුමින් සැරසුණ තිසසාව හා ස්වාමි පුත්‍රයා කතා කරමින් සිටිනවා දැක ඊර්ෂ්‍යාවෙන් මැඩුනු සිත් ඇත්තී කෝපයෙන් පස් ගෙන එයින් තිස්සාවට ගැසූ පවින් මෙසේ වූ බව කීවාය.


3. ඉක්බිති තිස්සාව විසින් ප්‍රේතියගෙන් කවර කර්මයක් හේතුවී නුඹ කැසීම් රෝගයකින් පෙළෙන්නීදැයි ඇසීය. එහිදී ප්‍රේතිය මනුලොව මත්තා නමින් සිටියදී කසඹිළියා ගෙඩි ගෙනවිත් තිස්සා (තම ස්වාමියාගේ අනෙක් භාර්යාව) නිදන යහනේ ඇතුරුවා වූ පාප කර්ම බලයෙන් මෙසේ වූ බව කීවාය.

4. ඉක්බිති තිස්සාව විසින් ප්‍රේතියගෙන් නුඹ නග්නව ඉපදීමට හේතුව කුමක්දැයි අසනු ලැබුවාය. පෙර මත්තා නමින් මනු ලොව මිනිස් කතක්ව සිටියදී වස්ත්‍ර සොරකම් කළ පවින් මෙසේ නග්නව උපන්නේ යැයි ප්‍රේතිය කීවාය.

5. ඉක්බිති තිස්සාව ප්‍රේතියගෙන් කුමක් හෙයින් (තෝ) අසූචි දුගඳ හමන්නියක් වූයේදැයි ඇසුවේය. පෙර ජීවිතයේදී ස්වාමි පුත්‍රයගේ අනික් බිරිඳගේ සුවඳ වර්ගද, මල් මාලාවක්ද, අගනා විලවුන්ද අරගෙන අසූචි වළක දැමූ පවින් මෙසේ දුගඳ හමන්නියක් වූ බව ප්‍රේතිය කීවාය. පසුව තිස්සාව විසින් භික්ෂූන් අට නමක් වඩම්මා දන් දී ඇය ප්‍රේත දුකින් නිදහස් කළාය. දිව්‍ය සම්පත් අත්කර දුන්නාය.


එබැවින් පින්වතුනි, මනුලොව ජීවත් වන හවදුකට හේතුවන කිළිටි කර්ම නොකොට පිරිසිදු ජීවිතයක් ගත කිරීමට සිතට ගත යුතු ය.

පූජ්‍ය රිදියගම සුධම්මාභිවංශ හිමි




# සදහම් ප්‍රහේලිකා අංක - 91

ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි පොත් මැදුරින් වටිනා ග්‍රන්ථයක් තිළිණ කෙරේ... දුරකථනය - 011-2695773




## උපදෙස් :

1. මෙය නිවැරදිව හා ඉතා පැහැදිලිව පුරවා තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ප්‍රහේළිකා අංක 90, දයාවංශ ජයකොඩි සහ සමාගම, 112, පූජ්‍ය එස්. මහින්ද හිමි මාවත, කොළඹ 10.
3. පිළිතුරු භාරගන්නා අවසාන දිනය 2015 ජනවාරි මස 10 දාය.
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේළිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071-3391013 අමතන්න.
6. ත්‍යාගය සඳහා විමසීම් සඳහා 011 2695773 (සුසිල්) අමතන්න.

### ▶ හරහට

1. බුදුන් වහන්සේ ආයු සංස්කාරය කළේ මෙම චෛත්‍යය අසලදීය.
3. සැදූහැවත් බවින් මහණ වූවන්ගෙන් අග්‍ර වූ තෙරණුවන්.
5. සියලු සත්ත්වයාම මෙය රැකගන්නට උත්සාහ දරති.
6. ඖෂධීය ගුණයෙන් යුතු ප්‍රණීත දෙයකි.
8. බුදුදහමේ ඉගැන්වෙන සප්ත භාර්යාවන්ට අයත්ය.
11. සතර බඹ විහරණවලින් එකකි.
12. හේමමාලා කුමරිය දන්ත ධාතුන් වහන්සේ රැගෙන ආවේ මෙම කුමරු සමගය.
14. කණගාටුව යන අරුත ගෙන දෙයි.
16. දෙතිස් මහා කුණපයන්ට අයත් වේ.

### ▼ පහළට

2. බුදු බව පතන්නට මේවා පිරිය යුතුය.
4. සඳ මත මේවා නොමැති බව දූන් අනාවරණය කරගෙන තිබේ.
6. මේවා දීමෙන් හා ගැනීමෙන් හිතමිතුරුකම් නැතිවිය හැකිය.
7. එදා දවස මගතොට යන අයගෙ දිය පිපාසය සංසිඳුවා ගන්නට උපකාර විය.
9. මනුෂ්‍යයාට මෙය අවශ්‍යම දෙයකි.
10. දෙවන ධර්ම සංගායනාවට අනුග්‍රහය දැක්වූ රජතුමා.
11. සාගරය යන්නට සමාන පදයකි.
13. මීට බොහෝ කාලයකට පෙර මෙබඳු නිකායට අයත් භික්ෂූන් වහන්සේලාද රටේ තැනින් තැන සංචාරය කළහ.
15. නරකාදියේ මහරජු.

ප්‍රහේලිකා අංක 89 - 90
ජයග්‍රාහකයන් පිළිබඳ විස්තර
ලබන කලාපයෙන්
බලාපොරොත්තු වන්න

---

## අලුත් අවුරුද්දේ ඔබත් දළදා වරුණට ලියන්න

**දළදා** වරුණ සැම විටම ඔබේ අදහස් උදහස් වලට ගරු කරන පුවත් සඟරාවකි. වසර දහයකට අධික කාලයක් තිස්සේ "දළදා වරුණ" සමඟින් ප්‍රවීණ ලේඛක මඬුල්ලක් බැඳී සිටින අතර ගිහි පැවිදි ඕනෑම අයෙකු අප වෙත ලබා දෙන කාලීන හරවත් සහ සමාජයට ප්‍රයෝජනවත් වේ යැයි සිතන දහම් ලිපි සඳහාද ඉඩ කඩ ලබා දීමට අප නිරතුරු සැලකිලිමත් වන්නෙමු. එහිදී දළදා වරුණ පුවත්පතේ පළවන සියලුම ලිපි, රචනා ඒ.ඒ. කර්තෘවරුන්ගේ අදහස් මිස දළදා මාලිගාවේ හෝ එහි සංස්කාරකවරුන්ගේ අදහස් නොවන බවද සිහිපත් කරනු කැමැත්තෙමි. තනි පිටුවේ පැහැදිලි අත් අකුරින් ලියන ලද හෝ යතුරු ලියනය කළ ඔබේ බෞද්ධ ලිපිය පහත ලිපිනය වෙත යොමු කළ යුතුය. සැම ලිපියක්ම බෞද්ධ තේමාවක් ඔස්සේ පිටු 2 කට නොවැඩි වන සේ ලිවිය යුතු බවද සලකන්න.

සංස්කාරක
"දළදා වරුණ" මාධ්‍ය ඒකකය
ශ්‍රී දළදා මාලිගය, මහනුවර

● අන්තර්ජාලයෙන් පසුගිය "දළදා වරුණ" කියවන්න
www.sridaladamaligawa.lk වෙබ් අඩවියට පිවිසෙන්න

## දළදා මාලිගයෙන් පණිවුඩයක්


● මෙම සටහන සිහියෙන්, සැලකිල්ලෙන් කියවන්න

1. ඔබගේ සංවර ඇඳුම ඔබේ හැදියාවේ සංකේතයයි.
2. ඔබගේ සංවර ඇඳුම මේ පින්බිම රමණීය කරයි.
3. ඔබගේ සංවරශීලී භාවය මේ පින්බිමට සෝභාවකි. එය ඔබට ගෞරවයකි.
4. දළදා සමිඳු වැඩ සිටින උතුම් පින්බිමට එනවිට ඔබ සැරසී සිටින ඇඳුම් උචිතදැයි සිහියෙන් සිතන්න.
5. ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රයට කොට කලිසම් (පිරිමි, ගැහැනු දෙපිරිසම) පලාපු සායවල්, අත් නැති/කොට හැට්ට, දණහිසෙන් ඉහළට වන සේ කොට වූ සායවල්, ඇඟ පසු පෙදෙස නිරාවරණය වන සේ වූ ඇඳුම් යනාදියෙන් සැරසී ඒමෙන් වළකින්න.
6. ඔබ දළදා මාලිගාවට පැමිණෙන විට චාම් ලා පාට ඇඳුමෙන් සැරසෙන්න.
7. තද පාට (කළු) ඇඳුම් පින් බිමට නොහොබින බව තේරුම් ගන්න.
8. ඇඳුම ඔබේ චරිතය කියාපාන කැඩපතක් බව සිතන්න.
9. දළදා මාලිගාව පින් බිමක් මිස පෙම්වතුන්ගේ පාරාදීසයක් නොවන බව සිහියට ගන්න.
10. ඔබට ඇත්තේ දෙඇසක් වුවද ඔබ වටා ඇස් දහසක් ඇති බව මෙනෙහි කරන්න.

ඔබ හැසිරිය යුත්තේ හැඟීම්වලට වහල් වී නොව බුද්ධිමත්වය. මෙම කරුණු අප ඔබ වෙත ඉදිරිපත් කළේ කරුණාවෙන් බවත්, රට භාර ගන්නට සිටිනා මතු පරපුරට ඔබගේ ආදර්ශයක් ලබාදීමට බවත් සිහිකරනු කැමැත්තෙමු.

# පස් පව්න් හා දස අකුසලින් මිදීමේ අනුහස් කියවෙන

# දුම්මේධ ජාතකය



දේවාතිදේව වූ බ්‍රහ්මාති බ්‍රහ්ම වූ පූජාති පූජනීය වූ කරුණානිධාන වූ අපමහා බුදුරජානන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සමයෙහි එක්තරා ලෝකාතථ චයාෆීවක් අරභයා මෙම ජාතකය දේශනා කොට වදාළ සේක.

බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජකෙනෙකු රාජ්‍ය කරන සමයෙහි අප බෝසතාණන්වහන්සේ ඒ රජුගේ අගමෙහෙසියගේ කුසෙහි පිලිසිඳගත්හ. මවුකුසින් බිහිවූ මහ බෝධිසතුන්වහන්සේට නම් තබන දිනයේ දී බ්‍රහ්මදත්ත කුමාරයා යැයි නම් තබන ලදි. ඒ බ්‍රහ්මදත්ත කුමාරයා සොළොස්හැවිරිදි වියට පත් කල්හි තක්සලා නුවර ආචාර්යයන් කරා ශිල්ප ශාස්ත්‍ර හැදෑරීම පිණිස යැවූහ. එහිදී සියළු වේදයන්හි පරතෙරට පත්ව සියරට බලා පැමිණි මහ බෝසතාණන්වහන්සේ පිය මහරජතුමා විසින් යුවරාජ තනතුරෙහි පිහිටවූහ

මෙසමයෙහි බරණැස්නුවර වැසියෝ දේව පූජා පැවැත්වීමේ පුරුද්දක් ඇතිව සිටියහ. දෙවියන් නමස්කාර කරන ඔවුහු බොහෝ එළුවන්, කුකුලන්, ඌරන් ආදී ප්‍රාණීන් ඝාතනය කොට එම රුධිරයෙන් හා නොයෙක් පුෂ්පයෙන් ද සුගන්ධ ජාතියෙන් ද යාග පූජා පැවැත්වූහ. මෙම පූජාවිධි දුටු මහ බෝසතාණන්වහන්සේ පිය රජතුමා හා මේ පුරවැසියෝ බෝහෝ ප්‍රාණ වද දෙමින් සත්ත්ව පූජා පවත්වමින් දස අකුසල කර්මයන්හි යෙදෙතියි මහත් කම්පාවට පත්වූ සේක.


ඉහත කී පාපකර්මයන් දැක මහත් කම්පාවට පත්වූ මහ බෝසතාණන්වහන්සේ පිය මහරජානන්ගේ ඇවෑමෙන් තමනට රාජ්‍ය හිමි වූ විටෙක එකෙදු සත්ත්වයෙකු නොමරා උපායෙන්ම ප්‍රාණවධ නොදෙන්නට ඉටාගත්හ. මෙසේ සිතා බෝසතාණන්වහන්සේ දිනක් රථයකට නැගී නුවරින් නික්ම මහා නුග වෘක්ෂයක් ඇති තැනකින් ගමන් කරන්නේ ඒ නුග වෘක්ෂය වෙත රැස්වූ මහජනයා එහි අධිගෘහිත දිව්‍ය පුත්‍රයා කෙරෙහි නොයෙක් යාග පූජා පවත්වමින් කන්නලවු කරමින් දූදරුවන්, ධන ධාන්‍ය ආදී කැමති දෙය ප්‍රාර්තනා කරන සැටි දුටුවේය. එය දුටු අප බෝසතාණන්වහන්සේ රථයෙන් බැස නුග වෘක්ෂය කරා ගොස් මලින් පූජා පවත්වා ජලයෙන් අභිෂේක කොට වෘක්ෂය ප්‍රදක්ෂිණා කොට දේවතා ඇදහිලිවන්තයෙකු පරිද්දෙන් වෘක්ෂ දේවතාවාට නමස්කාර කොට රථයට නැගී නුවරට වැඩි සේක. එතැන් පටන් ඒ වෘක්ෂ රාජයා වෙත ගොස් පෙර සේ පූජා පවත්වා ඒම සිරිතක් කොට ගත්හ. කාලයාගේ ඇවෑමෙන් පිය මහරජු පරලෝසැපත් වූයෙන් රාජ්‍යය හිමිවූ බෝසතාණන්වහන්සේ රාජධර්මයන් කෝප නොකරමින් දැහැමින් සෙමෙන් රාජ්‍යය විචාරමින් මෙසේ සිතූහ. දැන් මාගේ ප්‍රාර්ථනාව ඉටුකර ගැනීමට කාලයයි. මම රාජ්‍යයෙහි පිහිටියෙමි. එබැවින් මම පූර්වයෙහි සිතූ කරුණ ඉටුකර ගැනීමට කාලය එළඹ ඇත. එසේ සිතා අමාත්‍යයන්, බ්‍රාහ්මණ ගෘහපතියන් ආදීන් රැස්කරවා මා කවර කාරණයකින් රාජ්‍යයට පැමිණියේ වේදැයි ඔවුන්ගෙන් විචාලහ. එය ඇසූ අමාත්‍යයෝ නොදනිමුයි පැවසූ විට පින්වත්නි, මම රජ වීමට පෙරාතුව අසවල් වෘක්ෂ රාජයා වෙත වන්දනාව පිණිස යනවා දුටුවෙහිද? එහිදී මා කළ ප්‍රාර්තනාවෙක් ඇත. එනම් මෙම රාජ්‍යය තුළ යමෙක් ප්‍රාණඝාත ආදී පංචවිධ අකුසලකර්මයන් හා දස අකුසල කර්මයන්හි යෙදෙත් නම් එවැන්නන් දහසක් දෙනා තෝරා ඔවුනගේ හෘද මාංශයන් ගෙන දේවතාවාට බිලි

පූජා පැවැත්වීමට ඉටා ගතිමි. එබැවින් එසේ අකුසලයන්හි යෙදෙන දහසක් දෙනා යාගය පිණිස තෝරා දෙන්නැයි දන්වා සිටියහ. අමාත්‍යවරු බෝසතාණන්වහන්සේගේ වචනය අසා බරණැස්නුවර බෙර ලැවූහ. අඬා අණබෙරය අසා එකද දුස්සීල ක්‍රියාවක් සමාදන්ව සිටියාවූ එක පුරුෂයෙකුදු සොයා ගැනීමට නොහැකි වූහ. මෙසේ බෝසතාණන්වහන්සේ රජ්‍ය කළ කාලය පුරාවට එක් පුද්ගලයෙකු හෝ ක්ලාන්ත නොකරවා සීල රක්ෂාවෙහි යොමුකරවන ලදහ. මේ ආකාරයෙන් රටේ පුරවැසියන් පස්පවින් දස අකුසලින් මිදී කුසලයන් හි හැසිරෙමින් ලෝකයා හට වැඩ පිණිස කටයුතු කළහ. මෙසේ දුමෙමධ ජාතකය ගෙනහැර දක්වා පූර්වාපර සන්ධි ගලපා අතීත කථාව ගෙනහැර දැක්වූ සේක. මෙසේ බරණැස්නුවර රජව උපන්නේ තුන්ලොවට ගුරු වූ තිලෝගුරු අප මහා බුදුරජාණන්වහන්සේමය.

මෙම ජාතකයෙහි ලා වර්තමාන කථාව කණ්හ ජාතකයෙන් මෙසේ දත හැකිය. යටගිය දවස බරණැස් නුවර උසීරථ නම් රජ කෙනෙකුන් රාජ්‍ය කරන සමයෙහි කාශ්‍යප බුදුරජාණන්වහන්සේගේ ශාසනය බොහෝ කලක් පැවත පිරිහෙන්ට පටන් ගත්තේය. බුදුරජාණන්වහන්සේ නොකරන්නැයි කියා දුන් අවවාද විසිඑකක් පමණ ගිහිපැවිදි මනුෂ්‍යයන් විසින් කඩකරන ලදී. ඇතැම් භික්ෂූහු මෙහෙණියන් හා එක්ව සම්භෝගයෙහි යෙදීමෙන් දරුවන් හදා, ගිහීන් හා සමානව වාසය කොට මහණදම් අත්හලහ. ඇතැම් භික්ෂුණීන්වහන්සේ තමන්ගේ භික්ෂුණීභාවය අත්හලහ. උපාසකවරු තම උපාසක ධර්ම අත්හලහ. උපාසිකාවන් තමන්ගේ උපාසිකා ධර්ම අත්හරින ලදී. බ්‍රාහ්මණයෝත් තමන්ගේ බ්‍රාහ්මණ ධර්මය අත්හලහ. සියලු මනුෂ්‍යයෝ දසකුසල ධර්මයන් අත්හැර දසඅකුසල ධර්මයන්හි යෙදුණාහ. එසේ ගත කළ සත්වයන් මළ පසු නරකයෙහි ඉපදුණා විනා දිව්‍යලෝකයෙහි උපත නොලැබූහ.

ශක්‍රදේවේන්ද්‍රයෝ මේ තත්ත්වය දිවැසින් දැක කාශ්‍යප සර්වඥයන්වහන්සේගේ ශාසනය පිරිහෙයි, මනුෂ්‍යයන් භයගන්වා හික්මවමියි සිතා මාතලී දිව්‍යපුත්‍රයා කැඳවා ඒ බව පවසා, ඔහු ඇඹුල් කෙසෙල් ගෙඩි පමණ දළ ඇති අස්නාම්බෙකු සමාන බලු වෙසක් මවාගෙන, බල්ලා පස් තැනකින් බැඳගෙන ශක්‍රයා වැද්දෙකුගේ වේෂයක් මවාගෙන දළ ඇති බල්ලා අතින් රැගෙන බරණැස් නුවරට පැමිණියහ. මෙනුවරට ළඟා වූ බල්ලා මහත් ශබ්දයෙන් කෑගැසූහ. එය අසා බොහෝ මනුෂ්‍යයෝ ඇතුල් නුවරට වැද රජතුමන්ට එපවත් දැන්වූහ. රජ්ජුරුවෝ එපවත් එසා එසේ වී නම් වාසල් දොර අගුල් ලවන්නැයි අණ කළහ. සියලු පුරවැසියෝ ඇතුළු නුවරට වී දොරගුළුලාගෙන සිටියහ. එවිට ශක්‍රයා තමන්ගේ ශක්‍රානුභාවයෙන් අටළොස් රියන් පමණ උස ඒ නුවර වටා බැඳි පහුරෙන් පැන වීදියට වන්හ. මනුෂ්‍යයෝ භයින් තැතිගෙන දොරවල් අගුල් ලාගත්හ. බල්ලා රජ්ජුරුවන් ළඟ සිට දසදහසක් යොදුන් දඹදිවට ඇසෙන සේ මහත් හඬින් හඬතැලීය. මේ හඬ ඇසූ රජු ඇතුළු බොහෝ මනුෂ්‍යයෝ භයින් ත්‍රස්ත වූහ.

රජු රාජ ධෛර්යය උපදවා වැද්දාගෙන්, මේ කලු පැහැති මහත් දළ ඇති බල්ලා තොප කුමක් නිසා මෙහි ගෙනාවේදැයි විමසීය. එවිට වැදි වෙසින් සිටි ශක්‍රයා රජතුමනි, මේ බල්ලා තමාගේ බඩගින්න නිසා මෙසේ කෑගසන්නේයැයි පැවසීය. එවිට රජතුමාගේ අණින් සියලු



නිවෙස් වලින් පිසූ බත් ගෙනැවුත් දැමූ විට, බල්ලා එක කටින් කා නිම කළේය. නැවතත් කෑ ගැසීමට පටන් ගත් විට මූ යළි කෑගසන්නේ ඇයිදැයි විමසූ විට, මූ බඩගින්න නිසා හඬන්නේ යැයි වැද්දා යළිත් කීවේය. එවිට ඇතුන්ට, අසුන්ට පිසූ බත් ගෙනැවිත් දැමූ විට ඒවා ද බල්ලා එක කටින් කා යළිත් හඬන්ට පටන් ගත්තේය. එවිට රජතුමා, ඔබේ බල්ලා යළිත් මුරගාන්නේ ඇයිදැයි විමසීය. එවිටත් වැද්දා කිවූයේ, බඩගින්න නිසා බවය. එවිට රජතුමා, මේ බල්ලා බල්ලෙක් නොවේ. මෙතෙක් බත් කෑ නමුත් තෘප්තියට නොපැමිණියේය. මූ මහත් තේජස් ඇති යක්ෂයෙකැයි සිතීය. එම්බල වැද්දාණෙනි, තොපගේ බල්ලා බත් කා තෘප්තියට නොපැමිණියේය. මූ හඬන්නේ ඌරන්, මුවන්, ගෝනුන් මස් කන්ට ද, නැත්නම් මිනී මස් කන්ටදැයි විචාළේය. එවිට වැද්දා, මූ මුරගාන්නේ ඌරන්, මුවන් කන්ට නොව, මනුෂ්‍යයන් කන්ටයැයි කීවේය. එවිට රජු, තොපට කෑමට අවශ්‍ය වන්නේ වෛරී මනුෂ්‍යයන් ද, අවෛරී මනුෂ්‍යයන්

28 වැනි පිටුවට



දැයි විමසීය. එවිට වැද්දා වෛරී මනුෂ්‍යයෝ යැයි පැවසීය. එකල්හි ඔබට වෛරී මනුෂ්‍යයන් කවුරුදැයි රජු විචාළහ. එවිට යම් කෙනෙක් දුශ්ශීල නම් ඒ මනුෂ්‍යයෝ වෛරී වෙති. එවිට රජතුමා එය මට නොතේරෙයි, විස්තර ඇතිව කියන්නැයි ඉල්ලීය.


එකල්හි ශක්‍රයා එසේ නම් මෙසේ අසවයි කියා, යම් භික්ෂු කෙනෙක් සඟළ සිවුරු හැඳ, පාත්‍රය අතින් ගෙන, භික්ෂාටනය කෙරෙත් ද, එසේ වූ භික්ෂූන්වහන්සේලා සීසෑම්, වැපිරීම් ආදී වූ දෙය කොට, ගිහියන් සේ වාසය කෙරෙත් නම් ඒ අලජ්ජි භික්ෂූන් කෙරෙහි වෛර ඇත්තෙමි. ඔවුන් මේ බල්ලා ලවා කවා මරවමියි කීහ. එසේම යම් භික්ෂුණී කෙනෙක්, සඟළ සිවුරු පොරවා, පටිය බදිත්ද, පාත්‍රය අතින් ගෙන භික්ෂාටනය කෙරෙත් ද, එවැනි භික්ෂුණීන් වහන්සේලා ලෝකාශ්වාදයෙහි යෙදී දරුවන් වදා වාසය කෙරෙත් නම් එබඳු අලජ්ජි භික්ෂුණීන් මේ බල්ලා ලවා කවා මරවමියි කීය. එසේම යම් තාපස කෙනෙක් මැලියම් බැඳුණු දතින්, රජස් වැකුණු ශරීරයෙන් අවුල් වූ ජටාවෙන් තපස් රකින්නා වූ තාපසයෙක් ගිහියන්ට ණයතුරුස් දී, ගිහියන් හා සමානව වාසය කෙරෙත් නම් එබඳු තාපසයන් කෙරේ වෛර ඇත්තෙමි. ඔවුන් ද මේ බල්ලා ලවා කවා මරවමි. එසේම යම් බ්‍රාහ්මණ කෙනෙකුන් තමන්ගේ ත්‍රිවේදය හා යාගහෝම ආදී වූ දෙය ඉෂ්ටානිෂ්ට දෙක නොබලා, තුමූම සම්පත් බලා මෙබඳු යාගහෝමයක් කරම්හයි මනුෂ්‍යයන්ට නොකියාම කොට ඔවුන්ගේ සම්පත් අරගනිත් නම්, තමන් යාගහෝම, බ්‍රාහ්මණ ධර්මයෙහි නොපිහිටා කටයුතු කරන බ්‍රාහ්මණයනුත් බල්ලා ලවා කවා මරවමි. එසේම යම් සත්වයෙක් තමන්ගේ දෙමවුපියන් නොරකී නම්, එසේ වූ අය මේ බල්ලා ලවා මරවමියි කීහ. යම් සත්වයෙක් දෙමවුපියන්ට ආක්‍රෝෂ පරිභව කෙරෙත් නම් එබඳු අයත් මේ බල්ලා ලවා මරවමි. තවද යම් සත්ව කෙනෙකුන් තමන්ගේ කුඩා මවුන් කෙරේ ද, යාළුවන්ගේ බිරිඳ කෙරෙහි ද, තමන්ගේ බිරිඳගේ මෑණියන් කෙරෙහි ද, ගුරුවරුන්ගේ බිරිඳ කෙරෙහි ද දෝෂ කෙරෙත් නම් එසේ වූ මනුෂ්‍යයෝත් මේ බල්ලා ලවා මරවමියි කීහ. එසේම යම් බ්‍රාහ්මණ කෙනෙක් කඩු, පළිහ ආදී ආයුධ ගෙන මංමාවත්වල සිට මිනී මරා වස්තු උපදවත් ද, සේවාකම් කොට නොකරන දෙය කරන බ්‍රාහ්මණයනුත් මේ බල්ලා ලවා මරවමි. එසේම යම් ස්ත්‍රියක් පරදාරාදී නොකටයුත්තෙහි යෙදේ නම් ඇය ද මරවමි. එසේම එක් පුරුෂයෙකු දුන් සම්පත් ඒ පුරුෂයා සමඟ සිට සොරපුරුෂයෙකුට දෙත්නම් එවැනි ස්ත්‍රීහු ද බල්ලා ලවා මරවමි. එමෙන්ම යම් පුරුෂයෙක් පස්පව් පුරා දසඅකුසල් කරත් නම් එම පාපිෂ්ඨයාත් මේ බල්ලා ලවා මරවමි.

මෙසේ වූ පුරුෂයන් කරා ගොස් කන්නාක් මෙන් මනුෂ්‍යයන් භයගන්වා, ඉක්බිති ශක්‍රයෝ තමන්ගේ වැදිවේශය අතහැර, ශක්‍ර ස්වරූපයෙන් පෙනී සිට රජුට අවවාද කොට, රජතුමනි, බුද්ධ ශාසනය පසුබස්නා දැක පෙරළා ශාසනය අභිවෘද්ධි කරනු පිණිස ආවෙමියි කියා අවවාද කොට ශක්‍රයා ශක්‍ර භවනයටම ගියේය. එතැන් පටන් මනුෂ්‍යයෝ තමන් කරන්නා වූ දස අකුසල ධර්මයන් අතහැර දසකුසල ධර්මයෙහි හැසිරුණහ. සර්වඥයන්වහන්සේ වදාළ ආකාරයෙන් ප්‍රතිපත්තීන්හි පිහිටා සීලය රැක්කාහ. මෙසේ වදාරා අවවාදයෙන් ශාසනය දහසක් අවුරුදු නිස්කලංකව පැවති බව වදාළ සේක. එසමයෙහි ශක්‍රයෝ නම් අපගේ ගෞතම බුදුරජාණන්වහන්සේය.

දුමෙමධ ජාතකයේ අතීත හා වර්තමාන කථාවන්හි සඳහන් වන අයුරු පස්පවින් හා දස අකුසලින් මිදී කුසල ධර්මයන්හි හැසිරී නිවන් මග සාක්ෂාත් කර ගැනීමට මෙම උතුම් පොහෝදින අදිටන් කර ගනිමු.

**කේ. මීගහකුඹුර**

"මරුවාගෙන් පහර ලද්දහුගේ රැකවරණය පිණිස එන දරුවෝත් නැත. මවුපියෝත් නැත. නෑයෝත් නැත. නෑදෑ ආදී කිසිවකුට ඔහු බේරාගත නොහැක."





# ළදරු යැයි අවමන් නොකළ යුතු 04 දෙනා

එක් කලෙක බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම් අනේපිඬු සිටුහුගේ ආරාමයේ වැඩ වසන සේක. එකල පසේනදී කොසොල් රජතුමා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේය. එහිදී උන්වහන්සේට ගෞරව දක්වා එකත්පස්ව සිට සතුටු සාමීචියෙහි යෙදී අවසානයෙහි තථාගතයන් වහන්සේට මෙසේ සැල කළහ.

''භාග්‍යවත් ගෞතමයන් වහන්ස, ඔබවහන්සේ නිරුත්තර වූ සම්‍යක් සම්බෝධිය අවබෝධ කළ සේක්දැයි ප්‍රශ්න කළේය. එයට පිළිතුරු දුන් බුදුරජාණන් වහන්සේ ''මම නිරුත්තර සම්‍යක් සම්බෝධිය අවබෝධ කළ බව නිසැකයෙන්ම ඔබට කියමි.''

කොසොල් රජතුමා එය අසා ඉතා සතුටුට පත්ව, භාග්‍යවතුන් වහන්ස පැවිදි සමූහයා ඇති, පැවිදි ගණයා ඇති, ගණාචාර්ය ප්‍රසිද්ධ යසගී ගයන, අන්ධ බාල සාධු සම්මත වූ මහණ බමුණෝ වන පූරණ කස්සප, මක්ඛලී ගොසාල, නිගණ්ඨනාතපුත්ත, සැසද්ජය බෙලට්ඨිපුත්ත, සකුධකච්චායන, අජිතකෙසකම්බල යන මොවුන්ගෙන් නිරුත්තර සම්‍යක් සම්බෝධිය අවබෝධ කළම්හ දැයි ප්‍රශ්න කළ විට ඔවුන් එයට පිළිතුරක් නොදුන්හ. භාග්‍යවතුන් වහන්සේ ඔවුනට වඩා ඉතා තරුණය, බාලය, ළදරුය. පැවිද්දෙන්ද ඔවුන්ට වඩා බාල බව පෙනී යයි.

එයට පිළිතුරු දුන් බුදුරජාණන් වහන්සේ ''මහරජ, සිව්දෙනෙක් ළදරු යැයි නොසිතන්න.''

''ඒ සතර දෙනා නම් කවරහුද? ස්වාමීනි?''


''මහරජ, ක්ෂත්‍රිය වංශිකයා ළදරු යයි අවමන් නොකට යුතුය. තවද සර්පයා ළදරු යයි අවමන් නොකට යුතුය. තුන්වෙනුව ගිනි ළදරු යයි අවමන් නොකට යුතුය. එසේම සිව්වෙනුව මහණ පැවිද්ද ළදරු යයි අවමන් නොකට යුතුය.''

පසේනදි කොසොල් රජු වෙනුවෙන් ඒ

30 වැනි පිටුවට


''නිතර අනුන්ගේ දෙස් සොයන්නා වූ, අනුන් හෙළා තලා කතා කරන්නා වූ පුද්ගලයාගේ කාමාදී පාප ධර්ම වැඩෙත්. ඔහු රහත් ඵලයෙන් ඈත්ය.''

30 වැනි පිටුවෙන්



පිළිබඳව වඩාත් පැහැදිලි කළ බුදු
වහන්සේ කරුණු බෙහෙවින් විස්
සේක.
මිනිසුන්ට ශ්‍රේෂ්ඨ වූ ක්ෂ
රජ කරන කල්හි යමෙක් ඔහුට
කරන්නේද ඒ තැනැත්තාට රාජ
දිය හැකිය. කරදර පැමිණවිය
පෙවෙතට බාධා වන පරිදි ක්‍රියා
එමනිසා ක්ෂත්‍රියාට අවමන් කිරී
ශ්වර නොවේ.
යම් කෙනෙක් ගම්හිදී
කැලෑවකදී හෝ සර්පයකු දැක
කරදර නොකළ යුතුය. ඔහු ළ
යයි නොසිතිය යුතුය. තේජව
තෙමේ නා නා වේශයෙන් හ
හිරිහැර කරන ස්ත්‍රී, පුරුෂ ක
දෂ්ට කරන්නේය. ඒ නිසා ඒ
වැළකිය යුතුය.
ගින්දරද ආරම්භය සු
මහා කැලෑ ප්‍රදේශ, ගෙවල්
වටිනා යයි සම්මත සියලු
දවා අළු බවට පත් කරයි.
ළදරු යයි නොසිතිය යුතුය
වී සිටිය යුතුය.
සිල්වත් භික්ෂූනටද
නොකළ යුතුය. ඒ අයට
වෙන කිසිවක් නැත. සිල්
අවමන් කිරීම එලොව මෙ
අවැඩදායකය. එම නිසා
මනුෂ්‍යයෝ තමන්ට හිත
කීර්තිමත් ක්ෂත්‍රියාද, සර්
සිල්වත් භික්ෂූන්ද ඉතා
කළ යුත්තාහ.
පසේනදී කොසෙ
බුදුපියාණන්ගේ ධර්මය
ප්‍රමෝදයට පත්ව මෙසේ
''භාග්‍යවතුන් ව
යහපත්ය, යම් සේ යටි
උඩුකුරු කරන්නේද,
කරන්නේද, පාර වැරදු
මග කියා දෙන්නේද,
එය දුරු කරන්නේ ය
භාග්‍යවතුන් වහන්සේ
කරන ලද ධර්මය මම
භාග්‍යවතුන් වහන්ස,
ධර්මයාත්, සංඝයාත්
පටන් දිවිහිමියෙන්
උපාසකයකු ලෙස
ඔහු බුදු පාමු

ලලිතකලා කී
ගොංගී




''යම් කෙනෙකුගේ සිත දිවා රෑ දෙකේ අහිංසාවෙහි ඇළුණේද ඒ ගෝතම ශ්‍රාවකයෝ හැමදම

සළරුවක
කතාවක්


# මහින්තලය පුදබිම

## අනුරාධපුරය


එදා




අද




එදා



අද



# 60 වසරකට පෙර මුලින්ම ගුවනින් දහම් දෙසූ
# පැළෑණේ සිරිවජිරඤාණ මහනාහිමියෝ



දෙසැම්බර් 16 දිනට ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවයට වසර 90 සපිරිණි. එද මෙදතුර ජනමාධ්‍යයේ සිදුවූ විශේෂතා අතර එතෙක් පැවති බටහිර ගැති අන්තවාදී මතිමතාන්තර වෙනුවට සිංහල බෞද්ධ සංස්කෘතියේ මූලබීජය වූ ධර්ම දේශනා වැඩසටහන් ඇරඹීම අපට ඉතා වැදගත්ය.

සිංහල බසින් පැවැත්වූ ප්‍රථම ගුවන් විදුලි කතාව ලෙස හැඳින්වෙන දේශනය පැවැත්වීමේ ගෞරවය හිමිවන්නේ බම්බලපිටිය වජිරාරාමාධිපතිව වැඩ විසූ පැළෑණේ වජිරඤාණ නාහිමියන්ටය.

1928 අප්‍රේල් මස 21 වනද එම කතාව නිවේදක මහතා හැඳින්වූයේ මෙසේය.

"ඉතා චතුර කථිකයකු වූ පැළෑණේ නාහිමියන් වහන්සේ අද දින කතාවක් ප්‍රචාරය කිරීමට එකඟව සිටිති. මෙය ඉතා කාලෝචිත පියවරක් බවත් සිංහල ශ්‍රවණය කරන්නන්ට බලවත් ප්‍රීතියක් බවක් නොකිවමනාය. මතු අනාගතයේදී තවත් දක්ෂ සිංහල කථිකයන් ලවා කතා ප්‍රචාරය කරවා ගැනීමට අවශ්‍ය විධිවිධාන යොද ගෙන යනු ලැබේ."

මෙම දේශනා සඳහා වඩාත් උසස් ප්‍රතිචාර ලැබුණේ අසිංහලයකු වූ මාතර නීතිඥ ඒ. එම්. බුහාරි මහතාගෙනි.

"මම මුස්ලිම් භක්තිකයෙක්මි. පසුගිය දෙසැම්බරයේ මා ගුවන් විදුලි යන්ත්‍රයක් මිලදී ගැනීමෙන් පසු මට පළමුවෙන් අසන්නට ලැබුණු ධර්ම දේශනාව ඔබ වහන්සේගේය. එම පැය තුළ ධර්මයට සවන් දීමෙන් පමණක් ගුවන් විදුලි යන්ත්‍රය සඳහා වැය කළ මුදලේ ප්‍රයෝජනය මට ලැබිණි."

(1937 ඔක්. 22)

නවීන ශිල්ප ක්‍රම, උපදෙස් නොමැති යුගයක උන්වහන්සේගේ සිත්ගන්නා සුළු, සරල පැහැදිලි බසින් ගැඹුරු දහම් පද ලිහිල්ව විසඳමින් සජීවීව දම් දෙසූ ආකාරය චමත්කාරය.

එම දෙසුම් ඇසූ එකල අමාත්‍ය කර්නල් ජේ. එල්. කොතලාවල මහතා 1940 දී වජිරඤාණ නාහිමියන්ට තම කුටියේ සිටම දහම් දෙසීම සඳහා යන්ත්‍රෝපකරණ පිළියෙළ කළහ. වසර 20ක් නොකඩවා මසකට දෙවරක් දෙසුම් පැවැත්වූ උන්වහන්සේ 1947දී සිය කැමැත්තෙන්ම ගුවන් විදුලියට සමු දුන්හ.

කඹුරුගමුවේ දේවගිරි විහාරාධිපතිව වැඩ විසූ වේරගම්පිට සිරි රේවත හිමියන්ගේ සිසුවකු ලෙස 1893 දී පැවිදි බිමට පිවිස මරදන විද්‍යෝදය මහ පිරිවෙන්හිදී ධර්ම විනය හා භාෂා ශාස්ත්‍රාදිය මැනවින් හදළ උන්වහන්සේට හොඳම සිසුවාට පිදෙන "ශ්‍යාම රාජ ත්‍යාගය" (1900) දී පිරිනැමිණි.

ධම්මපද විවරණය සඳහා උන්වහන්සේ තුළ පැවැතියේ මහා දක්ෂතාවකි. ඒ විෂය පිළිබඳ එද ලියැවුණු ලිපි අප්‍රමාණය.

නිවැරදි ශෛලිය උච්චාරණය තුළින් ගලාගෙන යන ආකෘතිමය ස්වභාවය හා රස නොසිඳි බව වජිරඤාණ නාහිමියන්ගේ දෙසුම්හි අනන්‍යතාවයි. උන්වහන්සේ ඔත්පල වූ දිනවල පවා ළඟටම විත් දම් දෙසුම් සජීවීව දේශනා කිරීමට ඉඩ සලසා දුන් බව ගුවන් විදුලි වංශයේ සඳහන් වේ.

"ගඟක් ගලා යන විට ඇද කුද වෙලා ගලා යනවා වගේ භාෂාවේ ගමන් මගත් පරිණාමය වන බව සැලකිය යුතුයි."

"ධර්මාසනය කියන උතුම් ස්ථානය අනුන්ට නින්ද අපහාස ගර්ජනා කරන්න පාවිච්චි කිරීම සඳමඬලෙන් ගිනි පිට කිරීමක් හා සමානය."

මේ උන්වහන්සේගේ ලිපිවල සඳහන් කරුණු කිහිපයකි. උන්වහන්සේගේ ගෝල පරපුරද මෙරට කීර්තිමත්, සංඝ ශෝභන ගුණයෙන් යුත්, විචිත්‍ර ධර්මකථික අනුත්තර මහා සංඝ පීතෘවරු වෙති. 1937 පැළෑණේ නාහිමියන් ඇරඹූ 'බෞද්ධ ළමයා' ළමුන් අතර ඉතා ජනප්‍රිය වූ සඟරාවක් බව පෙනේ.

"දිනේ පටන් මා උපන්න<br>
මව් විඳි දුක් බැහැ කියන්න<br>
දෙහොත් මුදුන් තබා මෙන්න<br>
වඳිමි මව්නි පව් ඇරෙන්න

හඬන කලට මා නළවා<br>
ආදරයෙන් නිදි කරවා<br>
කැත කුණු මගෙ අත ගෑවා<br>
මව්තුමි ඔබ බුදු වේවා

සිරසර සඟරාවට ලියූ "පෙන්වීමට නොව හැබෑවටම විය යුතු" නම් වූ 58කින් යුත් කවි පන්තියද හැඟුම්බරය.

තිරිසන් සතුන් දුක දැක උණු හදය<br>
මිනිසුන් දුකෙහි යකඩට ගලකට තදය<br>
මෙලෙසින් ලොවට පෙන්වන කරුණා පොදය<br>
මිනිසුන් නොමැති ලොවකදි වඩහොත් හොඳය


උන්වහන්සේගේ පියා වූ දෙන් අන්දිරිස් තුඩාවේ පණ්ඩිත ගුණවර්ධන මුහන්දිරම්තුමාගේ භාෂා ඥානයත් පැවිදි බව ලැබ කඹුරුගමුවේ දිවියගලහේනේ දේවගිරි විහාරාධිපති වේරගම්පිටියේ සිරි රේවත හිමියන්ගේ කවීත්වයෙන් පැළෑණේ නාහිමියන්ගේ පෞරුෂ සංවර්ධනයට බලපෑම් කරන්න වූවා නිසැකය. 1955 සැප්තැම්බර් 21 ද උන්වහන්සේ මෙලොවින් සමු ගත්හ.

**පුෂ්පනාත් මල්ලිකාආරච්චි**

"ද්වේශ රහිත වූ යමෙක් බැණීම් ගැහීම් හා වධ බන්ධනත් ඉවසාද, ඉවසීම බලය කොටත් බල ඇණිය කොටත් ගත් ඔහු උත්තමයෙකි."

# අන්තරාභවික සඞ්කල්පය හා පුනර්භවය පිළිබඳ වූ ථෛරීය ධර්මවාද පරීක්ෂණය

ලිපි මාලා අංක 03



(පසුගිය ලිපිය හා බැඳේ.)

මෙලෙස ථෙරිය ධර්මවාදිකයන් විසින් අන්තරාභවික සඞ්කල්පය පිළිබඳ ව දක්වන ලද නානාර්ථවත් විග්‍රහයන් සම්‍යග් ඥාන දර්ශනයෙන් යුතුව ම වීමඞ්සය උදෙසා වටනේයි.

පුරාතන ථෙරිය ගුරුකුල සම්ප්‍රදායන් කීපයක් ම ද, මතු සත්වයාගේ අන්තරාභවිකත්වය කෙරෙහි කිසියම් ආකල්පයක් දරා ඇත්තේය. එහි දී සත්වයාගේ අන්තරාභවික සඞ්සිද්ධිය නම්, ච්‍යුතිය හා ප්‍රතිසන්ධිය අතුරෙහි ම පවතින්නක් බව සියල්ලටම සාධාරණීකරණය වූ මතවාදයයි. නමුත් අන්තරාභවය, බෞද්ධ දර්ශනයෙහි පැණෙනා කාම, රූප හා අරූප යන භවත්‍රයෙහිලා නො ගිණෙන්නක් වන්නේ ද යනු, විසඳීමට සුකර නොවන සඞ්කීර්ණ ස්වරූපී ප්‍රශ්නයෙකි.

ආභිධම්මික කථාවත්ථුප්පකරණාට්ඨකථාව විවරණය කරන අන්දමින් පූර්වශෛලීය හා සම්මිතීය නිකායාන්තරිකයෝ සත්වයාගේ අන්තරාභවිකත්වය පිළිගන්නා ලද්දෝ වූහ. සෞත්‍රාන්තික සර්වාස්තිවාදීහු ද, අන්තරාභවය පිළිබඳ වූ මාතිකත්වය දරූ බව මහායානික අභිධර්ම කෝෂයෙන් ස්ඵුට වන්නේය. විඥානවාදී යෝගාචාරිකයෝ ද, යෝගාචාර භූමි ශාස්ත්‍රයෙහි දක්වූ පරිදි තද් මතයෙහි ම තත්පර වූහ. මෙහිදී යථා සමයාන්තරයන් කෙරෙන් හෙළිවන අන්තරාභවික සඞ්කල්පය, ථෙරවාදීය ධර්ම සිද්ධාන්තයන් හා තුලනය වන අයුරු විමසීම ද, අගනේ යැයි හඟිමි.

කථාවත්ථුප්පකරණ අට්ඨකථාවෙහි දක්වන අන්දමින් අන්තරාභවික සත්වයා දිවැස් නැත්තෙකු ව හිඳ දිවැස් ඇත්තෙකු සෙයින් ද, ඍද්ධි නොමැත්තෙකු ව හිඳ ඍද්ධි ඇත්තෙකු ලෙසින් ද, මාපිය සඞ්වාසයක් හා මවගේ ඍතු ගැන්වීම අපේක්ෂා කරමින් සත් දිනක් හෝ ඒ හා වැඩිමනත් කාලයක් දිවි පවත්වන්නේයි, යනුයි.

"යත්ථ සත්තො දිබ්බචක්ඛුකො විය ච අදිබ්බ චක්ඛුකො ඉද්ධිමා විය ච අනිද්ධිමා මාතාපිතු සඞ්ගමඤ්චෙව උතුසමයඤ්ච ඔලොකයමානො සත්තාහං වා අතිරෙක සත්තාහං වා තිට්ඨති."

(පඤ්චප්පකරණ නාම කථාවත්ථුප්පකරණාට්ඨකථා)

යට දක්වන නියමයෙන් අන්තරාභවිකයා යටත් පිරිසෙයින් සත්දිනක් තදාවස්ථිකයෙහි සිටිය යුතු බව පෙනේ. නො එසේ නම්, ඇතැම් විට අතිරේක දින හතක් (= අතිරෙක සත්තාහං වා) රැඳිය සිටිය යුතු බව ද, අනාවරණය කෙරේ. විඥානවාදී යෝගාචාරිකයන්ගේ මතාන්තරය, කිසියම් තැනෙක ථෙරවාදීය අන්තරාභවික අර්ථ නිරූපණය හා අසමානිත වන බවක් දිස් වේ. කවර නිසාවෙන් ද? යෝගාචාරිකයෝ, භව සඞ්ක්‍රමණික ආත්ම භාවයෙහි ප්‍රතිසන්ධිය සඳහා අවැසි ප්‍රත්‍ය සන්ධානය සම්පූර්ණ වී ද, අන්තරාභවිකත්වය සත්දවසකුදු නොපවත්නේය. එකී ප්‍රත්‍ය සමවාය අසම්පූර්ණ වී ද, සත්වයා දින හතකින් මියැදී ගොස් එහිම, පුනර්ජන්මය ලබන්නේය. මෙසේ සත්දිනක් අත්‍යන්තරයෙහි මියැදුණු සත්වයාගේ පුනර්භවය සිදුවිය යුත්තේය යනුවෙන් අරුත් දක්වූහ.

"ස පුනඃ අන්තරාභවඃ සප්තාහං තිෂ්ඨති අසති උපපත්ති ප්‍රත්‍යයලාභෙ, සති පුනඃ ප්‍රත්‍යය ලාභෙ අනියමඃ අලාභෙ පුනඃ ච්‍යුත්වා පුනඃ සප්තාහං තිෂ්ඨති. යාවත් සප්ත සප්තාහානි තිෂ්ඨති. උපපත්ති ප්‍රත්‍යයං අලභමානඃ තතඃ ඌර්ධවං උපපත්ති ප්‍රත්‍යයං ලභතෙ."

(යෝගාචාර භූමි ශාස්ත්‍ර - ද්විතීය පරිච්ඡේද - 46 පිට)

කථාවත්ථුප්පකරණ අට්ඨකථාව වදහළ අන්දමින් සත්වයා අන්තරාභවය වෙත පමුණුවන අන්‍යකාරක කර්මචිත්තයෙක් නොමැත්තාහ. මියැදුණු සත්වයාගේ ච්‍යුති චෛතසිකය කවරෙක් වී, තදානුසාරීව ප්‍රතිසන්ධි විඥානධාතුව මතු භවයක් කරා සඞ්ක්‍රමණය වේ ද, එම ච්‍යුති චිත්තය ම අන්තරාභවයෙහි ද වන්නේය යනු, එහි විග්‍රහයයි.

"කෝපයෙන් මත් වූ තැනැත්තා උමතු අශ්වයෙකු පිට නැඟී යන්නෙකු වැනිය"

"පරසමයේ අනතරාභවූපගං නාම පාටියෙක්කං කම්මං නත්ථි. යං යං භවං උපපජ්ජිස්සති. තදූපගෙනෙව කම්මෙන අන්තරාභවෙ නිබ්බත්තිස්සතීති තෙසං ලද්ධි."

(පඤ්චප්පකරණ නාම කථාවත්ථුප්පකරණාට්ඨකථා)

කථාවත්ථු අටුවා ඇදුරෝ යට තන්හි, අන්තරාභවය නම්, සත්වයාගේ කරජමය (= මව්පිය සඞ්වාසයෙන් හටගත්) වූ භෞතික ශරීරය කෙරෙන් තොර වූ පූර්ව ජීවිකයාගේ ම මතු පැවැත්මකැයි අරුත් වෙසෙස් දක්වූහ. නමුත් තද් අටුවාකාරයෝ යම් තැනෙක, අන්තරාභවිකයාගේ ජාති, ජරා, මරණ හා ච්‍යුති - ප්‍රතිසන්ධි ස්‍රෝතය ද නොපිළිගත් බවක් පෙනේ.

"තත්ථ ජාති ජරා මරණානි චෙව චුතිපටිසන්ධි පරම්පරඤ්ච අනිච්ඡන්තො පටික්ඛිපති. තෙනෙව අන්තරාභවූපගං තාදිසානි අලද්ධා හොහීති."

(පඤ්චප්පකරණ නාම කථාවත්ථුප්පකරණාට්ඨකථා)

එහිදී පශ්චාත්කාලීන ථෙරිය බුදුසමය, හුදෙක් අන්තරාභවිකයයාගේ පැමිණීමක් මිස ජාතිත්වයක් නොමැත්තේ යැයි වාද පරායණ වූහ. අන්තරාභවික සඞ්කල්පය සම්බන්ධයෙන් විඥානවාදී යෝගාචාර සමයවාදය හා ථෙරීය ධර්මවාදයෙහි පැණෙනා විසඞ්වාදීතාවය මෙයිනිදු ප්‍රකට කෙරේ.

ඒ හැර ද, කථාවත්ථු අටුවාකාරයෝ අන්තරාභවික සත්වයා කාම - රූප - අරූප ලෙස නාමාප්ත තෙභූමික ලෝ ධාතුන් කෙරෙන් මුක්ත නොවන අතර ම, එකොළොස් කාමාවචර සත්ව කොට්ඨාශයෙහි ම බහා තැබූහ.

"අත්ථි අන්තරාභවූපගා සත්තාති පුට්ඨොපි කාම භවූපගායෙ ච නාමතෙති ලද්ධියා පටික්ඛිපති."

(පඤ්චප්පකරණ නාම කථාවත්ථුප්පකරණාට්ඨකථා)

අන්තරාභවගමිකයා කාමාවචර භූමි අතුරෙහි ද, කාම භවයෙහිලා ම ගිණේ. කුමක් නිසාවෙන් ද? ථෙරවාදීය විසුද්ධිමග්ගාට්ඨකථාව පහදන පරිද්දෙන් පූර්ව ජාතීහි රූපා රූප ධ්‍යාන සමාපත්තීන්හි වැඩ සිටියෝ ම තද් භවයන්හි පුනර්ජන්මය ලබන බැවිණි.

"යෙ අපරිහීනජ්ඣානා බ්‍රහ්මලොකෙ නිබ්බත්තිස්සාමාති බ්‍රහ්මලෝකූපපත්තිං පත්ථෙන්තා වා අපත්ථයමානා වා පි පුථුජ්ජනා සමාධිනෝ න පරිහායන්ති... තෙසං භව විසෙසාවහන්තා අප්පණා සමාධිභාවනා භවවිසෙසානිසඞ්සා හොති..."

(විසුද්ධිමග්ග - සමාධිභාවනා නිද්දෙස)

එහෙත් යෝගාචාරිකයෝ කාම - රූප යන උභයාකාර භවයෙහි ම අන්තරාභවික සත්වයාගේ විතික්‍රමණයක් වේ යැයි පැවසූහ. එහිදී ජාති, ජරා, මරණ, සෝකාදිය ද නොමැති බව ඔවුන් විසින් මතාන්තරයි. යෝගාචාරිකයෝ පවසන අන්දමින් අන්තරාභවිකයා සත්දිනක් අන්තරයෙහි ප්‍රතිසන්ධි ලාභය නො ලද හොත් සත්දිනෙන්, සත්දින මියැදෙමින් එහිම වෙසේ. තද් ලෝකාන්තරය රූප ලෝකෝත්පත්තියෙක් හා සමානිත වන්නාහ, යනු ද එහි වූ අතිරේකාර්ථය යි.

"ස පුනඃ අන්තරාභවඃ ආරූප්‍යෝපපත්ත්‍යායතනං ස්ථාපයිත්වා දෘෂ්ටව්‍යඃ"

(යෝගාචාර භූමි ශාස්ත්‍ර - ද්විතීය පරිච්ඡේද - 47 පිට)

රූපාවචර ලෝකයන්හි උපත් ලබන්නෝ ගන්ධ හා ස්පර්ශාදී ඉන්ද්‍රියාරම්මණයන් කෙරෙහි සඞ්වේදී නොවන බව ද ආහාර පරිභෝජනයෙන් මිදෙණ බව ද එහිළා, ථෙරිය ධර්මවාදීන්ගේ විග්‍රහය වන්නේය.

"රූප ලොකෙ පන සාන ජිව්හා කාය භාව දසකානිචෙව ආහාරජකලාපානි ච න ලබ්භන්ති."

(අභිධම්මත්ථ සඞ්ගහ - රූප සඞ්ගහ විභාග)

යථා ස්වභාවය නම්,, හුදෙක් කාමාවචර ලෝකයන්හි නො දිස්වෙන, රූපාවචර ලෝක ධාතුන් වෙතම අනන්‍ය වූවෙකි.

කථාවත්ථු අට්ඨකථාවෙහි විවරණය කරනා පරිදි, අන්තරාභවිකයාගේ රූප කලාපය සාමාන්‍යාකාරී මිනිසෙකුගේ පියෙවි නෙතට අදිසියහ. ඔහුගේ වේදනා, සඞ්ඥා, සඞ්ඛාර හා විඥාන යන අනෙකුත් ස්කන්ධ චතුර්ථකය ද, ඕළාරික තත්වයෙහිළා, හිත්න නොවේ.

"රූපාදිවසෙන පුට්ඨො පි යස්මා අන්තරාභව සත්තස්ස අනිදස්සනං රූපං වෙදනාදයො පි අඤ්ඤෙසං විය න ඔළාරිකොති. තස්ස ලද්ධි තස්මා පටික්ඛිපති."

(පඤ්චප්පකරණ නාම කථාවත්ථුප්පකරණාට්ඨකථා)

ථෙරවාදීය කථාවත්ථු අටුවායෙහි නො පැවසෙන නමුත් සර්වාස්තිවාදී අභිධර්ම කෝෂයෙහි විග්‍රහානුගතව විමසේ නම්,



අන්තරාභවිකයාගේ රූප කලාපය පූර්වභවයෙහි රූපකාය හා සමානිත වන්නේය.

"එකක්ෂේපාත් අසා වෛෂ්‍යත් - පූර්වකාලභවාකෘතිඃ
සපුනර් මරණාත් පූර්වං - උපපත්තික්ෂණාත් පරඃ"

(අභිධර්ම කෝෂ - තෘතීය කෝෂස්ථාන - 13 ශ්ලෝක)

මෙලෙස ථෙරවාදිකයන් හා සමයාන්තරිකයන් අන්තරාභවිකත්වය පිළිබඳ වූ අන්‍යෝන්‍ය විසඞ්වාදී මතවාදයන් දරන ලද අයුරු පසක් වේ. කෙසේ නමුත් තද් විග්‍රහනයන් කෙතෙක් දුරට ථෙරීය ධර්ම - විනය හා සමානුපාතික වේ දැයි තවදුරටත් විමසිය යුත්තේමයි.

මතු සම්බන්ධයි.

හවෙ නිබ්බාණාය සඞ්වත්තෙය්‍ය!

**රාජකීය පණ්ඩිත වාඩිගල සමිතරතන හිමි,**
**මහාවිහාර මහ පිරිවෙණ, අස්ගිරිය, මහනුවර.**